| බොෝධිරුක්ඛාරාම පාර හරස් මාර්ගය (රංජිත් ධර්මසේන මහතාගේ නිවස පාර)කොන්ක්‍රිට් යොදා සංවර්ධනය කිරිම. 01/03/03/50/13/2017 | 510,000.00 | 510,000.00 | 451,496.29 | 406,346.67<br>44,699.63 | 34,967.10 | අවසන් ගෙවීම් මුදල හා අතරුදවුම් මුදල ගෙවූ පසු ලිපිගොනු අනුව අවසන් ගෙවීම් වාර්තා මුදලට සමාන වේ. ලිපිගොනු අනුව සියලුම ගෙවීම් සිදු කර ඇත. |
| ගල්කඩේ හන්දිය කොස්ගහවත්ත පාර කොන්ක්‍රිට් යොදා සංවර්ධනය කිරිම. 01/03/03/50/15/2017 | 510,000.00 | 510,000.00 | 498,768.28 | 448,891.46<br>49,876.82 | 1,962.00 | අවසන් ගෙවීම් මුදල හා අතරුදවුම් මුදල ගෙවූ පසු ලිපිගොනු අනුව අවසන් ගෙවීම් වාර්තා මුදලට සමාන වේ. ලිපිගොනු අනුව සියලුම ගෙවීම් සිදු කර ඇත. |
| කොතලාවල උයන පාරේ පලමු පටුමග කොන්ක්‍රිට් යොදා සංවර්ධනය කිරිම. 01/03/03/50/16/2017 | 510,000.00 | 510,000.00 | 448,960.95 | 448,960.95<br>49,884.54 | 2,716.49 | අවසන් ගෙවීම් මුදල හා අතරුදවුම් මුදල ගෙවූ පසු ලිපිගොනු අනුව අවසන් ගෙවීම් වාර්තා මුදලට සමාන වේ. ලිපිගොනු අනුව සියලුම ගෙවීම් සිදු කර ඇත. |
| ගම්මන්පිල පන්සල අසල ධම්මාලංකාර මාවත කොන්ක්‍රිට් යොදා සංවර්ධනය කිරිම. 01/03/03/50/17/2017 | 510,000.00 | 510,000.00 | 500,334.97 | 450,301.48<br>50,033.49 | 2,800.75 | අවසන් ගෙවීම් මුදල හා අතරුදවුම් මුදල ගෙවූ පසු ලිපිගොනු අනුව අවසන් ගෙවීම් වාර්තා මුදලට සමාන වේ. ලිපිගොනු අනුව සියලුම ගෙවීම් සිදු කර ඇත. |
| කිදෙල්පිටිය ගැටඹුව පාර කොන්ක්‍රිට් යොදා සංවර්ධනය කිරිම. 01/03/03/50/18/2017 | 510,000.00 | 510,000.00 | 494,140.22 | 444,726.20<br>49,414.02 | 11,829.41 | අවසන් ගෙවීම් මුදල හා අතරුදවුම් මුදල ගෙවූ පසු ලිපිගොනු අනුව අවසන් ගෙවීම් වාර්තා මුදලට සමාන වේ. ලිපිගොනු අනුව සියලුම ගෙවීම් සිදු කර ඇත. |
| බටදොඹුව ලාවුළුගහවත්ත පාර කොන්ක්‍රිට් යොදා සංවර්ධනය කිරිම. 01/03/03/50/23/2017 | 510,000.00 | 510,000.00 | 489,125.00 | 440,212.50<br>48,912.50 | 2,430.00 | ණයහිමි ලේඛනයට ඇතුලත් වී ඇත්තේ ගිවිසුම් ගත මුදලයි.ලිපිගොනු අනුව සියලුම ගෙවීම් සිදු කර ඇත. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| කිරිපැල්ලගහවත්ත වටරවුම් පාරේ ආරියදාස මහතාගේ නිවස අසල පාර කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරිම. 01/03/03/50/27/2017 | 510,000.00 | 510,000.00 | 503,607.35 | 453246.62<br>49,791.70 | 1,962.00 | ණයහිමි ලේඛනයට ඇතුලත් වි ඇත්තේ ගිවිසුම් ගත මුදලයි.ලිපිගොනු අනුව සියලුම ගෙවීම් සිදු කර ඇත. |
| කිරිපැල්ලගහවත්ත වටරවුම් පාර කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරිම. 01/03/03/50/28/2017 | 510,000.00 | 510,000.00 | 505,569.35 | 453,246.62<br>50,360.73 | 1,962.00 | ණයහිමි ලේඛනයට ඇතුලත් වි ඇත්තේ ගිවිසුම් ගත මුදලයි.ලිපිගොනු අනුව සියලුම ගෙවීම් සිදු කර ඇත. |
| **සභා අරමුදල් -2018** | | | | | | |
| ඌරකඩුව ගංගාරාම විහාරස්ථානයට පිවිසෙන අතුරු මාර්ගය කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරිම. | 350,000.00 | 348,274.92 | 339,792.04 | 305,203.35<br>33,979.20 | 8482.88 | ණයහිමි ලේඛනයට ඇතුලත් වි ඇත්තේ ගිවිසුම් ගත මුදලයි.ලිපිගොනු අනුව සියලුම ගෙවීම් සිදු කර ඇත. |
| | | | | | **3,210,381.26** | |

- **ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.සමන්පා දිනේන්ද්‍ර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදිමක් නොවු බැවින් ඒකමතිකව සහා සම්මත විය.**

**06-01-X** බොල්ගොඩ මැතිවරණ කොට්ඨාශයේ නිවාස අංක4 පොදු ළිද සඳහා වෙන් කර ඇති ඉඩම නාමික වටිනාකම අය කර නීත්‍යානුකූලව ප්‍රාදේශීය සභාව වෙත පවරා දීමට ජාතික නිවාස සංවර්ධන අධිකාරිය 2022.04.05 දින යොමු කරන ලද ලිපියෙන් දන්වා ඇත. ඒ අනුව එකී පොදු ළිද සභාවට පවරා ගැනිම සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

- **ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.සුනිල් ප්‍රනාන්දු මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදිමක් නොවු බැවින් ඒකමතිකව සහා සම්මත විය.**

**06-01-XI** කළු ගඟ ජල සම්පාදන පලමු පියවර යටතේ වැල්මිල්ල ප්‍රදේශයේ ජල කුළුනක් ඉදිකිරිම සඳහා ලබා දුන් බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවට අයත් කිදෙල්පිටිය ග්‍රාම නිලධාරී වසමේ පිහිටි බලයලත් මිනින්දෝරු එස්.ජී.රණසිංහ මහතා විසින් සම්පාදිත පිඹුරු අංක 1825 පර්චස් 99.55ක් වන ඉඩමෙහි වාර්ෂික බදු මුදල (තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබා දුන්) රු.398,000.00කි. බදු ගිවිසුම් කෙටුම්පත (ඇමුණුම් අංක 02) පිළිගැනීම සුදුසු බවටත්, ජාතික ජල සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය සමඟ බදු ගිවිසුම්ගත වීමටත් සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

- **ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එල්.රොෂාන් රාජිත මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදිමක් නොවු බැවින් ඒකමතිකව සහා සම්මත විය.**

**06-01-XII** සුපිරි වෙළඳ සංකීර්ණයේ පහත මාලයේ පැවති තක්සේරුව 2022.03.16 දිනෙන් අවසන් වී ඇති අතර තක්සේරු දෙපාර්තමේන්තුව මගින් 2022.05.31 දිනෙන් ලැබී ඇති නව තක්සේරුව 2022. ජූලි මස සිට ඉදිරි වසර 2ක් සඳහා බල පැවැත්වෙන බව වාර්තා කර ඇත. ඒ අනුව එම වෙළඳ පරිශ්‍රය සඳහා 2022.03.19 දින සිට 2022.07.01 දක්වා කාලසීමාවට කඩ කුළී අය කර ගැනීම නව තක්සේරුව අනුව අය කර නව තක්සේරුව අනුව කඩ කුළිය ඉදිරි වර්ෂ 2ක කාලය සඳහා ගිවිසුම්ගත වීමටත් සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

**යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන් පී.පෙරේරා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් කොතලාවල මැතිතුමා - එක්සත් ජාතික පක්ෂය</u>

ගරු සභාපතිතුමනි, මේ ගිවිසුමමෙන් අලුත් ගිවිසුමකට එන කොට කඩ හිමියන් විසින් ඉල්ලීමක් කරලා තියෙනවා අඩු කරලා දෙන්න කියලා. මේ වසර දෙකේ ගෙවීමට අපහසුයි ව්‍යාපාර කටයුතු අඩාල වෙලා නිසා කියලා. ඔබතුමා මොකක්ද ඒකට ගත්ත පියවර.

<u>ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>

නව තක්සේරුවත් එක්ක අපිට මීට වඩා අඩු කිරීමක් කරන්න බෑ. මම දකින විදිහට උපරිම සාධාරණ මිලක් තමයි තක්සේරුව එවලා තියෙන්නේ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජේ.සමිත් ජානක ප්‍රනාන්දු මැතිතුමා - ජනතා විමුක්ති පෙරමුණ</u>

තක්සේරු වටිනාකම ගෙවනවාටත් වඩා ඒ අය ඉල්ලන්නේ එක පාර මුදල් ගෙවන එක මාස් පතා වගේ ගෙවන්න සහනදායි ක්‍රමයක් හදලා දෙන්න කියලා.

<u>ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>

සහනදායී ක්‍රමයකට තමයි සාකච්ඡා කරලා ඉතිහාසයේ කඩ කුළී ගෙවන ආකාරය බලලා කමිටුවක් මගින් තමයි අවසානයේ තීන්දුවක් ගන්නේ මේ ක්‍රමවේදය අනුව මුදල් අයකර ගමු කියලා. දැනටත් එක කඩයක් තියෙනවා රු.275000/-ක් ගෙවලා නැති. ඒ වගේ කඩ කීපයක් තියෙනවා සභාවට මුදල් ගෙවලා නැති. ලක්ෂ 20ක් තියෙනවා සමුපූර්ණයෙන් හිඟය විතරක් අයකර ගන්න මේ සියලු කඩ වලින්. මාස්පතා ගෙවන වැඩපිලිවලට ගියොත් මේ විදිහටවත් අපිට ලැබෙන්නේ නෑ. ඒ නිසා තමයි කලින් මුදල අය කර ගමු කියලා මේ ක්‍රමවේදයට පිවිසුනේ. අපි සහන දීලත් මේ වෙනකන් මුදල් ගෙවපු නැති අය ඉන්නවා. අපි තීන්දුවක් ගත්තා ළඟදීම ඒ අයව දැනුවත් කරලා නීතිමය කටයුතු කරන්න. මේ සමහර කඩ ලොකු මුදලකට අතුරු බදු දීලා තියෙනවා. නමුත් ඒ කඩවලින් සභාවට අය විය යුතු මුදල ගෙවලා නෑ. සහන උපරිම දීල තියෙනවා කොවිඩ් කාල වකවානුවේ. ලක්ෂ 15ක් කපා හැරලා තියෙනවා. මීට වඩා තවත් සහන ලබා දෙන්න බෑ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජේ.සමිත් ජානක ප්‍රනාන්දු මැතිතුමා - ජනතා විමුක්ති පෙරමුණ</u>

සභාපතිතුමා අපිට ඒ අයත් එක්ක කතා කරලා කාල රාමුවක් හදාගත්ත බැරිද? මේ මේ කාලවල ගෙවන්න ඕන කියලා එකඟතාවයක් හදාගන්න බැරිද?

<u>ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>

අධිකරණ තීන්දුවකට යන්න කලින් අපි ඒ අයව දැනුවත් කරනවා දින 30ක් ඇතුළත ගෙවීම් කරන්න කියලා. ඒ අයට පුළුවන් නිලධාරීන් එක්ක කතා කරලා සහනයක් දෙනවද මොන වගේ ආකාරයෙන්ද ගෙවන්නේ කියලා සාකච්ඡා කරන්න. නමුත් ලිපි යැව්වට පස්සේවත් ඒ අය එන්නේ නෑ. ඒ අයට උවමනාවක් තියෙනවා නම් මේකට සහනයක් ගන්න ඒ අයට පුළුවන් දින 30ක් යන්න කලින් ඇවිත් කතා කරන්න. එහෙම ආවේ නැති උනාම තමයි නීතිමය කටයුතු කරන්නේ. ඒ අයට සහනයක් අවශ්‍ය නම් දින 30 ඉක්ම යන්න කලින් ඇවිත් කතා කරන්න කියන්න. එතකොට අපිට පුළුවන් සාකච්ඡා කරලා සහනයක් දෙන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් කොතලාවල මැතිතුමා - එක්සත් ජාතික පක්ෂය</u>

ඒ අය ඉල්ලීම් 3ක් ඉදිරිපත් කරලා තියෙනවා. ඒකෙ 3 වන ඉල්ලීම තමයි අවම වසර 3ක් සඳහාවත් පෙර ගිවිසුමේ සඳහන් මාසික බදු මුදලම අය කර තෙවන වසර සඳහා නව තක්සේරු මුදල ලබා දෙන්න කියලා. මේ ඉල්ලීම් තුනෙන් එකකට හරි ඇහුන්කන් දෙන්න. අපි වෙළඳ සංකීර්ණය සම්බන්ධව රැස්වන කමිටුවට ව්‍යාපාරික සංගමයටත් එන්න කියමු.

<u>ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>

තක්සේරු දෙපාර්තමේන්තුවෙන් දාපු ගණන් අපිට වෙනස් කරන්න බෑ මන්ත්‍රීතුමා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන් පී.පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ
සභාපතිතුමා ඔබතුමාට ලිපියක් ලැබුනා කිව්වත් මේ ලියුමට අත්සන් කරපු අය ඉන්නවද අතුරු බදු දීපු අය. එහෙම අය ඉන්නවා නම් කිසිම සහනයක් දීම අවශ්‍ය නෑ. අතුරු බදු දීපු අයගෙන් කඩහිමියෝ කුළිය ගන්නවා. කඩ බදු දීම මාෆියාවක්. ගිවිසුමේ තියෙනවා අතුරු බදු දීම තහනම් කියලා. කරන්න ඕන මේ අයව ඉවත් කරලා හරි කෙනාට කඩය දෙන එක. අතුරුබදු දීමේ වංචාව වහාම නවත්වන්න ඕනා. මේ විදිහට සභාවට ආදායමක් ගන්න බෑ. කොරෝනා අවස්ථාවේ මේ කඩවලට ඇති තරම් සහන දුන්නා. එහෙම සහන දීලත් ලක්ෂ 20ක් හිඟ තියෙනවා කියන්නේ මේ මොන විහිළුවක්ද? ඒ නිසා හරි තීන්දුව ගන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජේ.සමිත් ජානක ප්‍රනාන්දු මැතිතුමා - ජනතා විමුක්ති පෙරමුණ
සුපිරි වෙළඳ සංකීර්ණය අපේ පාලනය යටතේ තමයි බදු දුන්නේ. ඒකෙත් අතුරු බදු දීලා නම් මේ සභාව එපැයි වග කියන්න ඕනා. දැනුත් දීලා තියෙනවා නම් ඒකට මොකක්ද මේ සභාව ගන්න තීරණය.

ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ
ඒක නිසා තමයි අපි එක කඩයකට නඩුවක් දාලා තියෙන්නේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන් පී.පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ
ඒ නඩුව තුළින් අනිත් ඒවට පූර්වාදර්ශයක් ගන්න පුළුවන්. සභාපතිතුමා අපිට පුළුවන් අතුරු ව්‍යවස්ථාවක් හදන්න කඩ බදු දීම සම්බන්ධව. මේ සභා වාරය ඉවර වෙන්න තව කෙටි කාලයයි තියෙන්නේ. අපි යුක්තිය ඉටු කරලා යමු රටටම ආදර්ශයක් වෙන විදිහට.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පියසේන වික්‍රමාරච්චි මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ
මේ අතුරු බදු සීම ගැන අපි නිතර සභාවේ කතා කරනවා. මේ සභාවට තීරණයක් ගන්න බැරිද අතුරු බදු දීම නීති විරෝධියි නම් නීතියට අනුව කටයුතු කරන්න ඕනා. එහෙම නොවුනොත් මේ කාලයේ හිටපු අපි වග කියන්න ඕනා. ඒ නිසා අපි අපෙත් ගෞරවය තියාගමු.

ගරු ප්‍රාදෙශීය සභා මන්ත්‍රීනි ඩී.චම්පා ජයංගනී කන්නන්ගර මැතිනිය - එක්සත් ජාතික පක්ෂය
ගරු සභාපතිතුමා, බෙලි ගහ තිබුන කැන කඩ පේළියත් අතුරු බදු දීලා තියෙනවා. අතුරුබදු දීම ලොකු අසාධාරණයක් දැන් ඉන්න වෙළෙන්දන්ට. ඒ නිසා අතුරු බදු දීමට සම්පූර්ණවිරුද්ධත්වය විපකත්ෂය වශයෙන් අපි ප්‍රකාශ කරනවා.

- **ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන් පී.පෙරේරා මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06-01-XIII** ආයුර්වේද උඩු මහලේ කඩ කුළිය නව තක්සේරුව අනුව 2021.03.19 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අය කර ගැනීමට 2022.05.24 පැවති මහ සභාවේ තීරණ අංක 6-1-XVI අනුව සම්මත වූ අතර, එකී හිඟ කඩ කුළී ගාස්තුව තක්සේරුව ප්‍රමාද වීම හේතුවෙන් එකවර ගෙවීමට සිදු වී ඇත. රටෙහි පවතින ආර්ථික තත්ත්වය මත එසේ කිරීමට නොහැකි වන බැවින් කොටස් වශයෙන් ගෙවීමට සහනයක් ලබා දෙන ලෙස එම කඩහිමියන් කරන ලද ඉල්ලීම සලකා බැලීම සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

- **ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජේ.සමිත් ජානක ප්‍රනාන්දු මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06-01-XIV** 2022.01.11 දින රැස් වූ මහ සභා රැස්වීමේ තීරණ අංක 6-1-VIII අනුව සභාව සඳහා ඉන්ධන ලබා ගැනිම සඳහා රු.100,000/-ක අත්තිකාරම් මුදලක් සී/ස බන්ඩාරගම විවිධ සේවා සමුපකාර සමිතියේ තබා ඇත. 2022.05.05 දිනැති ලිපියකින් සමුපකාරයෙන් ඉල්ලුම් කොට ඇත්තේ දැනට පවත්නා වෙළඳපොළ මිල ගණන් අනුව තැන්පත් කර ඇති අත්තිකාරම් මුදල කිසිසේත් ප්‍රමාණවත් නොවන බැවින් අත්තිකාරම් මුදල රු.300,000/-වැඩිකරන ලෙසයි. ඒ අනුව රු.300,000/-ක තැන්පතුවක් සමුපකාර සමිතිය වෙත තැබීමට සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

- **ගරු සභාපති එච්.ජී.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ජී.දිලාන් රසික මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06-01-XV** සභාව සතු ට්‍රැක්ටර් රථඅලුත්වැඩියා කිරිම වෙනුවෙන් අමතර කොටස් ඇතුළු ද්‍රව්‍ය ලබා ගැනීමට ඉදිරිපත් කළ මිල ගණන් අනුව 2022.04.21 රැස් වූ ටෙන්ඩර් මණ්ඩල අනුමතය පරිදි අවම මිල ඉදිරිපත් කළ එම්.සෙනෙවිරත්න (පුද්) සමාගම වෙතින් 2022.05.04 දින මිලදී ගන්නා ලදි. ඒ සඳහා වැය වූ රු.718,630.00ක මුදල එම්.සෙනෙවිරත්න (පුද්) සමාගම වෙතට සභා අරමුදලින් ගෙවීම සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

- **ගරු සභාපති එච්.ජී.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුරංජිත් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06-01-XVI** 2022.05.24 දින සමාසික මහ සභාවේ තීරණ අංක 6-1- XIV හා 6-1- XV අනුව සුපිරි වෙළඳ සංකීර්ණයේ ඉහළ මහල් බදු දීම සම්බන්ධව පත් කළ කමිටුව පහත නිර්දේශයන් ඉදිරිපත් කර ඇත.

- 2020 දෙසැම්බර් 04 වන දින ටෙන්ඩර් කරන ලද සුපිරි වෙළඳ සංකීර්ණයේ උඩු මහල් පරිශ්‍රයන් අවන්හලක් සඳහා යොදා තිබුන ටෙන්ඩර් කොන්දේසිය ඉවත් කර සුදුසු ව්‍යාපාරයක් සඳහා නැවත ටෙන්ඩර් කිරීම. (පංති කාමරයක්,ඇඟළුම් මහළක්,කාය වර්ධන මධ්‍යස්ථානයක්)
- පළමු මහළ පරිශ්‍රයන් තනි තනිව හෝ පරිශ්‍රයන් දෙක එකක් ලෙසත් දෙවන මහළේ පරිශ්‍රයන් තනි තනිව හෝ පරිශ්‍රයන් දෙක එකක් ලෙසත් බදු දීමට සුදුසු බවටත්,
- තක්සේරුව වලංගු කාල සීමාව 2022.07.09 දිනෙන් අවසන් විමට නියමිත බැවින් නව තක්සේරුවක් ලබා ගැනීමට කටයුතු කර එකී නව තක්සේරුව පදනම් කරගෙන අවම කුලිය තීරණය කිරිම සුදුසු බවටත්,
- සුපිරි වෙළඳ සංකීර්ණයේ ඉහළ මහල් බදු දීමේදී මාසික කුලිය මෙන් මාස 6ක කාල සීමාවකට වටිනාකමින් ඇප තැන්පතුවක් මුදලින් පමණක් ලබා ගැනීමට සුදුසු බවටත්,
- ඉහත කොන්දේසිය බල පැවැත්වෙන බැවින් 2020 දෙසැම්බර් 04 දින ටෙන්ඩර් කරන ලද කොන්දේසිවලට අනුව ඇප ආරක්ෂණ මුදලක් තැන්පත් කිරීමට තිබූ කොන්දේසිය ඉවත් කිරීම සුදුසු බවත්,
- ව්‍යාපාර ආරම්භ කිරීමේදී යෙදවිය යුතු ප්‍රාග්ධනය අධික වීම හේතුවෙන් අදාළ ටෙන්ඩර් කාල සීමාව වසර 3ක් ප්‍රමාණවත් නොවිම සලකා බලා ටෙන්ඩර් කාල සීමාව වසර 10ක් දක්වා දීර්ඝ කිරීම සුදුසු බවත්,
- අදාළ කඩ කාමරය බදු ගැනීමෙන් අනතුරුව අතුරු බදු දීම වෙනත් පාර්ශවයකට පැවරීම හෝ පරිශ්‍රයන් බෙදා වෙන් කොට වෙළදාම් කිරීම හෝ අතුරු බදු ගැනුම්කරු විසින් සිදු නොකළ යුතු බවටත්,
- පසුගිය වසර ටෙන්ඩර් කරන ලද අනෙකුත් ටෙන්ඩර් කොන්දේසි හා ගිවිසුම පිළිගැනිම සුදුසු බවටත් නිර්දේශ කරන ලදි.

ඉහත කමිටු නිර්දේශද සළකා බලා බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවට අයත් බණ්ඩාරගම සුපිරි වෙළඳ සංකීර්ණයේ පළමු මහළ හා දෙවන මහළ බදු දීම සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ සඳහන් විධි විධාන ඒ සඳහා පරිපූර්ණ වී ඇති බැවින් උපරිම වසර 10ක කාල සීමාවක් සඳහා ටෙන්ඩර් ක්‍රියා මාර්ග යටතේ බදුගැනුම්කරුවෙකු තෝරා ගැනීම සඳහා පහත නිර්නායක පදනම්ව සිංහල,දෙමළ හා ඉංග්‍රීසි පුවත්පත් 3ක ටෙන්ඩර් දැන්වීම් පළ කිරීම සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

(අ) පළමු මහල වර්ග මීටර් 247.146 හා 178.43කින් සමන්විත වේ. එබැවින් පළාත් තක්සේරුකරුගේ තක්සේරු වාර්තාවේ සඳහන් මුදල අවම වටිනාකම ලෙස සලකා පළමු මහලේ වර්ග මීටර් 247.146 හා 178.43කින් සමන්විත පරිශ්‍ර දෙක තනි ව හෝ පරිශ්‍ර දෙක එකක් ලෙස සලකා සුදුසු ටෙන්ඩර් කරුවෙකු තෝරා ගැනීම සඳහා පුවත්පත් දැන්වීම් පළ කිරීමත්,

(ආ) බණ්ඩාරගම නගර මධ්‍යයේ පිහිටා ඇති නව වෙළඳ සංකීර්ණය දෙවන මහළ වර්ග මීටර් 247.146 හා 178.43කින් සමන්විත අති සුබෝපභෝගී තත්ත්වයෙන් යුතු පරිශ්‍රයන් දෙක තනිව හෝ පරිශ්‍ර දෙක එකක් ලෙස සළකා සුදුසු ටෙන්ඩර්කරුවෙකු තෝරා ගැනීම සඳහා පුවත්පත් දැන්වීම් පළ කිරීම සුදුසු බවට යෝජනා කරමි.

**යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එල්.රොෂාන් රාජිත මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.**

<u>ගරු ප්‍රාදෙශීය සභා මන්ත්‍රීනි ඩී.චම්පා ජයංගනී කන්නන්ගර මැතිනිය - එක්සත් ජාතික පක්ෂය</u>
ගරු සභාපතිතුමනි, මේක පුද්ගලයෝ දෙතුන් දෙනෙකුට නැතුව පාටිෂන් කරලා කඩ කාමර වශයෙන් දෙන්න පුළුවන් කමක් නැද්ද? එතකොට ව්‍යාපාරිකයින් කිහිප දෙනෙක්ටම ඒකෙන් අවස්ථාව ලැබෙනවා. අනිත් එක අවුරුදු 10කට බදු දෙනවට නම් මම විරුද්ධයි. මොකද පහු වෙන කොට කියයි අපි අවුරුදු 10ක් බදු අරන් ඉන්නේ කියලා. ඒ වගේ නැතුව අවුරුදු 5ක් වගේ කාල සීමාවකට දෙනවා නම් හොදයි.

<u>ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>
අපි කමිටුවක් පත් කරල ාකමිටුවෙද තමයි මේ නිර්දේශ ගත්තේ. ඒකෙදී මේ සම්බන්ධව දීර්ඝ වශයෙන් සාකච්ඡා කලා. එකක් තමයි කඩ කාමර වශයෙන් පාටිෂන් කරලා දීමේ අපහසුතාවයක් තියෙනවා. මේකෙ තියෙන විදුලිය, ජල, A/C, වැසිකිළි පහසුකම් එක්ක එහෙම කඩ කාමර හදන්න අමාරුයි. එහෙම කරනවා නම් නැවත විශාල මුදලක් වැය කරන්න ඕනා. දැන් මේක එක මහළක් 4 දෙනෙකුට බදු ගන්න අවස්ථාව තියෙනවා. අනිත් එක පරිශ්‍රය විශාල නිසා ව්‍යාපාරයක් කරන කොට මූලික පිරිවැයක් වැය කරන්න සිද්ධ වෙනවා. ගියවරත් මේ හේතුව නිසාම තමයි ටෙන්ඩරය ප්‍රතික්ෂේප කරලා තියෙන්නේ. මේ කරුණු කමිටුවේදී සළකා බලලා තමයි වසර 10ක් දක්වා දෙන්න සුදුසුයි කියලා නිර්දේශ කරලා තියෙන්නේ.

<u>ගරු ප්‍රාදෙශීය සභා මන්ත්‍රී මහේෂ් කොතලාවල මැතිතුමා - එක්සත් ජාතික පක්ෂය</u>
ඒක කමිටුවේදී කතා කර ගත් පරිදි නැවත ටෙන්ඩර් කරනන් ලොකු මුදලක් යන නිසා පැරණි ටෙන්ඩර් ගත්ත පුද්ගලයාටම යළිත් දැනුවත් කිරීමක් කරන්න කියලා මම කමිටුවේදී කිව්වා. එතුමත් එක්ක කතා කරලා දෙන්න පුළුවන් නම් ටෙන්ඩර් කරන මුදල් අපතේ යාම වළක්වාගන්න පුළුවන්.

<u>ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>
මම ඒ පිළිබඳව එතුමාව දැනුවත් කළා. එතුමා මාව ලිඛිතව දැනුවත් කරන්නම් කිව්වා. නමුත් තවම දැනුවත් කලේ නෑ. එතුමාගේ ලිපිය ලැබුනොත් අපි කමිටුවේදී කතා කරමු.

<u>ගරු ප්‍රාදෙශීය සභා මන්ත්‍රී ඩී.ජේ.සමිත් ජානක ප්‍රනාන්දු මැතිතුමා - ජනතා විමුක්ති පෙරමුණ</u>
සභාපතිතුමා, එතුමා ටෙන්ඩරය ගන්නේ නැතුව සැළකිය යුතු කාලයක් ගියා. එතුමාගේ පාර්ශවයෙන් සඳහන් කිරීමක් වුනේ නෑ. කාලය පිළිබඳව ප්‍රශ්නයක් නිසා තමයි මේක ගත්තේ නැත්තේ කියලා අදහසක් ආවේ නෑ. එතුමා මීට කලින් ඒ සම්බන්ධව ප්‍රකාශ කළා නම් ඒක ගැන සළකා බලන්න තිබුනා. ඒකෙන් සභාවට ලොකු පාඩුවක් වුනා. නැවත වරක් එතුමා ලබා ගනියි කියලා අවිනිශ්චිතතාවයකින් ඉන්න බෑ. ඒ නිසා මේක ලොකු ජනතා දේපළක් සම්බන්ධව නිසා නිවැරදි තීන්දුවක් ගන්න ඕනා.

<u>ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>
මේ සම්බන්ධයෙන් කතා අහන්න මම කැමති නෑ. විනිවිදභාවයෙන් කළ හැකි දේ අපි කරමු.

- **ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එල්.රොෂාන් රාජිත මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06-01-XVII** බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවට අයත් බණ්ඩාරගම සුපිරි වෙළඳ සංකීර්ණයේ පළමු මහළ හා දෙවන මහළ බදු දීම සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 19 වන වගන්තියෙහි (1) වන උප වගන්තියෙහි X,XI හා XII යන අනුවගන්ති යටතේ සඳහන් විධි විධාන ඒ සඳහා පරිපූර්ණ වී ඇති බැවින් උපරිම වසර 10ක කාල සීමාවක් සඳහා ටෙන්ඩර් ක්‍රියා මාර්ග යටතේ බදුකරුවෙකු තෝරා ගැනීම සඳහා පහත සඳහන් පරිදි මහජන නියෝජිතයින්ගෙන් හා නිලධාරීන්ගෙන් සමන්විතව ටෙන්ඩර් මණ්ඩලය හා ඇගයීම් මණ්ඩලය ප්‍රාදේශීය සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ රීති අනුව පත්කර ගැනීම සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

<u>ටෙන්ඩර් මණ්ඩලය</u>

| | | |
|---|---|---|
| සභාපති | - එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා | - සභාපති, බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව |
| සාමාජික | - බී.ඩී.ජී.කේ.ගයන්ති | - ලේකම්, බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව |
| සාමාජික | - කළුතර පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් නම් කරන නිලධාරියකු | |
| සාමාජික | - මහ සභාව විසින් නම් කරනු ලබන සභිකයින් 02 (කාන්තා නියෝජනයද සැළකිල්ලට ගත යුතුය) | |

<u>ඇගයීම් මණ්ඩලය</u>

| | | |
|---|---|---|
| සභාපති | - ගුණදාස හපුආරච්චි | - ගණකාධිකාරී,කළුතර නගර සභාව, |
| සාමාජික | - සී.එච්.නිශාන්ත සිල්වා | - වැඩ අධිකාරී,බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව |
| සාමාජික | - කළුතර පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් නම් කරන නිලධාරියකු | |
| සාමාජික | - එන්.එස්.මුදලිගේ | - ප්‍රධාන කළමණාකරණ සේවා නිලධාරී |
| සාමාජික | - එම්.එල්.ආසිරි | - ආදායම් පරීක්ෂක,බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව |

**යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන් පී.පෙරේරා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන් පී.පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>
ටෙන්ඩර් මණ්ඩල කමිටුවේ සාමාජික ලෙස උප සභාපති සරත් ආර්.රණසිංහ මැතිතුමාව යෝජනා කර සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රනිත් වැලිවිටගේ මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>
ඒ යෝජනාව මම ස්ථිර කරනවා.

<u>ගරු ප්‍රාදෙශීය සභා මන්ත්‍රීනි ඔසිල්මා මානෙල් කුමාරි ආටිගල මැතිනිය - එක්සත් ජාතික පක්ෂය</u>
ටෙන්ඩර් මණ්ඩල කමිටුවේ සාමාජික ලෙස කාන්තා නියෝජනය වෙනුවෙන් චම්පා ජයංගනී මැතිණියව යෝජනා කර සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් කෙතලාවල මැතිතුමා - එක්සත් ජාතික පක්ෂය</u>
ඒ යෝජනාව මම ස්ථිර කරනවා.

- **ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන් පී.පෙරේරා මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන් පී.පෙරේරා මැතිතුමාගේ හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ඔසිල්මා මානෙල් කුමාරි ආටිගල මැතිණිය යෝජනා කර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රනිත් වැලිවිට මැතිතුමාගේ හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් කෙතලාවල මැතිතුමාගේ ස්ථිරත්වයෙන් සභාව විසින් නම් කරනු ලබන ටෙන්ඩර් කමිටු සාමාජික සභිකයින් දෙදෙනා ලෙස උප සභාපති සරත් ආර්.රණසිංහ මැතිතුමා හා ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ඩී.චම්පා ජයංගනී**

**කන්නන්ගර මැතිණිය පත් කිරීමෙන් පසුව ටෙන්ඩර් මණ්ඩලය හා ඇගයිම් මණ්ඩලය ඉහත සඳහන් පරිදි පත් කර ගැනීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.**

**06-01-XVIII** බණ්ඩාරගම නගර මධ්‍යයේ පිහිටි සුපිරි වෙළඳ සංකීර්ණයේ පළමු මහලේ හා දෙවන මහලේ වෙළඳ පරිශ්‍රයන් බදු දීම සඳහා සකස් කරන ලද කෙටුම්පත් බදු ගිවිසුම (ඇමුණුම් අංක 03) පිළිගැනීමටත්, එම ගිවිසුම් අනුව ගිවිසුමගත වීම සුදුසු බවටත්,එකී ගිවිසුමේ සඳහන් වගන්ති සළකා බලා ටෙන්ඩර් කොන්දේසි පැනවීම සුදුසු බවටත් මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

- **ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන් පී.පෙරේරා මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සහා සම්මත විය.**

**06-01-XIX** බණ්ඩාරගම ප්‍රාදෙශීය සභාවේ 678/බී නිව්ඩාව ග්‍රාම සේවා වසමේ කොස්ගහවත්ත,ඕන්විල්ලා උඩුමුල්ලවත්ත හෙවත් එස්.එන්.ඒ.එස්ටේට් නැමති ඉඩමේ බිම්කට්ටි හිමිකරුවන් පොදුවේ භුක්ති විඳිනු ලබන හැරවුම් වෘත්තය නිශ්චිතව හඳුනා ගැනීම සඳහා සභාව මගින් මිනුම් කටයුතු කර මායිම් සලකුණු කිරීම සුදුසු බවත්, එම ගාස්තු සභා අරමුදලින් දැරීම සුදුසු බවටත් මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

- **ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.මංජුල මනෝහාර් මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සහා සම්මත විය.**

**06-01-XX** 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතින් පැවරී ඇති බලතල හා වෙනත් ලිඛිත නීති යටතේ සඳහන් පරිදි පළාත් පාලන ආයතන වලට බලතල පැවරීම අනුව බල ප්‍රදේශය තුළ මහජන සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ අදාළ වන්නා වූ සියළු කටයුතු කිරීමටද,කසල කළමණාකරණය,පරිසර බලපත්‍ර,වෙළඳ බලපත්‍ර,ආදාහනාගාර සේවා පවත්වාගෙන යාමේ කටයුතු,සංචාරක ව්‍යාපාර ස්ථාන පරීක්ෂා කර වර්ගීකරණය කිරීම,බල ප්‍රදේශය තුළ හෝටල් පරීක්ෂා කිරීම,ගොඩනැගිළි පරීක්ෂා කිරීම හා සැළසුම් කමිටුව සඳහා සහභාගී වීම යන කටයුතු කිරීම සඳහා බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව වෙත ස්ථාන මාරු වී පැමිණි මහජන සෞඛ්‍ය පරීක්ෂක ජේ.කේ.ඩී.එම්.ජයවර්ධන මහතා වෙත 2022.06.10 වන දින සිට බලාත්මක වන පරිදි බලතල පැවරීම සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

**යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.සමන්පා දිනේන්ද්‍ර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.**

<u>ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>

බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවට මෙතෙක් PHI මහත්මයෙක් හිටියේ නෑ. අපිට අලුතින් PHI මහත්මයෙක් ඇවිත් ඉන්නවා. ඒ අනුව තමයි එතුමාට බලතල පැවරීම සිදු කරන්නේ. මම නිවේදන යටතේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය මගින් එවපු ලිපියක් සභාගත කළා. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය සමඟ අපි දීර්ඝ කාලයක් තිස්සේ සුහදව කටයුතු කළා. මෙතුමා සභාවට පත් වීමෙන් පසුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය ඉල්ලීමක් කළා දැනට කොට්ඨාශ මට්ටමින් PHI මහත්මයන්ව බෙදලා තියෙනවා සභාවට අනුයුක්තව ආපු පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් අපිට ලබා දුන්න PHI මහත්මයාටත් එක කොට්ඨාශයක් ලබා දෙන්න කියලා.
එක කොට්ඨාශයකට එතුමාව සීමා කරන්න මම කැමති නෑ. අපිට ලොකු ප්‍රශ්න රාශියක් තිබුනා. මහජන පැමිණිලි සම්බන්ධව PHI මහත්මයාව යොමු කරන්න ඕනා. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය හරහා ඒ කාරියන් ඉටු කර ගන්න සති 2-3ක් යනවා. ඒ වගේම කඩ, හෝටල් පරීක්ෂා කිරීම පරිසර ගැටළු පරීක්ෂා කිරීමේ වගකීම පළාත් පාලන ආයතනය විසින් සිදු කළ යුතුයි. මේවා පරීක්ෂා කිරීමේ හැකියාව දැන් අපිට තියෙනවා. ඒ වගේම කසල කළමණාකරණයට අපිට සෘජුවම සම්බන්ධ වෙන්න පුළුවන් PHI මහත්මයාව සම්බන්ධ කරගෙන. ඒ නිසා මම පුද්ගලිකව එකඟ නෑ එතුමාව එක් කොට්ඨාශයකට සීමා කරන්න. පළාත් පාලන ආයතනයක් විදිහට මහජන පැමිණිලි, පරිසර බලපත්‍රලබා දීම්,වෙළඳ බලපත්‍ර ලබා දීම් කසල කළමණාකරණය ඩෙංගු වැඩසටහන් PHI මහත්මා හරහා ක්‍රියාත්මක කරන්න හැකියාව තියෙනවා.

ඒ වගේම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාරියාලය බලාපොරොත්තු වන සහයෝගය වෙනදා වගේම ඒ අයගේ වැඩකටයුතු වලට අවශ්‍ය දායකත්වය ලබා දෙමින් මේ කාර්යන් කාර්යක්ෂමව කිරීම සුදුසුයි කියලා තමයි මම යෝජනා කරන්නේ. මේකෙ ගැටළුකාරී තත්වයකට නොගිහින් ජනතාවට ලබා දිය යුතු සේවය කායීක්ෂම කිරීම තමයි අපේ බලාපොරොත්තුව.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එල්.රොෂාන් රාජිත මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>
ඔබතුමාගේ යෝජනාවට අපි සියලු දෙනාම එකඟයි. බණ්ඩාරගම නගරය ආර්ථික වශයෙන් සභාවට යමක් ලබා ගන්න පුළුවන් නගරයක්. මේ යම් මාෆියාවකට යට වෙලා තිබුනා. මෙතුමා සභාවට පැමිණීමත් එක්ක ඒවාට යම් අවහිරතාවයක් වෙනවා. ඒ නිසා වෙන්න ඇති මෙතුමාව කොට්ඨාශයකට සීමා කරන්න හදන්නේ. ඒ වගේම PHI මහත්මයාට උපදෙස් දිය යුතුයි එතුමාට බලපෑම් එන්න පුළුවන්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජේ.සමිත් ජානක ප්‍රනාන්දු මැතිතුමා - ජනතා විමුක්ති පෙරමුණ</u>
සභාපතිතුමාගේ යෝජනාව හොඳයි. සභාවට PHI මහත්මයෙක් ඉන්න ඕනා. පසුගිය වකවානුව තුළ PHI මහත්වරුන්ගෙන් ලොකු සේවයක් වුනා ඒ අතර යම් යම් අක්‍රමිකතා කරන PHI මහත්වරුත් ඉන්නවා. සභාවටම වෙන් වුන PHI මහත්මයෙක් සිටීම ඇත්තටම වටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් කොතලාවල මැතිතුමා - එක්සත් ජාතික පක්ෂය</u>
ඉතාම හොඳ යෝජනාවක්. බන්ඩාරගම නගරයේ කඩ හිමියන්ගේ ප්‍රශ්නවලදි හැමදාම මතු වෙන ප්‍රශ්න ටිකක් තියෙනවා. සමහර හෝටල්වල ආහාර සම්බන්ධව ප්‍රශ්න තියෙනවා. ඒ නිසා සභාවේ PHI මහත්මයෙක්ගේ සේවය අගය කොට සළකනවා. බණ්ඩාරගම හන්දියේ ගැටළු සම්බන්ධව අපිටත් හොයලා බලලා ඔබතුමාට කෙළින්ම දැනුවත් කරන්න පුළුවන්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී දීපානි කඳනආරච්චි මැතිණිය - ශ්‍රී ලංකා නිදහස් පක්ෂය</u>
මේ දිනවල බණ්ඩාරගම නගරය වටේම තෙල් පෝළිම් දකිනවා. ඒ හැම තැනකම දවස් ගණන් මිනිස්සු රැඳිලා ඉන්නවා. මේ අය පාවිච්චි කරන කෑම කොළ බෝතල බියර් ටින් පාර දෙපස දාලා තියෙනවා. ඒ වගේම ඒවා ඒ කසල කාණු වලටත් දාන නිසා කානු අවහිර වීමක් සිදු වෙනවා. මේ විසි කරන කසල නිසා ඩෙංගු අවධානමක්ද ඇති වෙනවා. බණ්ඩාරගම කානු පද්ධතිය පිරිසිදු කරලා ජලය ගලා බසින ආකාරයෙන් නැවත සකස් කර ගන්න අවශ්‍යයි. ඔබතුමා ඒ සඳහා අදාළ ආයතන සමඟ සම්බන්ධ වෙලා ඒ සියලුම කානු පරීක්ෂා කරලා පිරිසුදු කරලා බන්ඩාරගම අලංකාර නගරයක් බවට පත් කරන්න. ඩෙංගු වලින් තොර නගරයක් බවට පත් කරන්න කියලා ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.අජිත් සෙනෙවිරත්න මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>
දැන් කොට්ඨාශ මට්ටමින් PHI මහත්මයෙක් ඉන්නවා. සභාවටත් ඉන්නවා. මේ දෙදෙනා අතර මනා සම්බන්ධතාවයක් තිබිය යුතුයි කටයුතු කිරීමේදී. නැත්නම් අනවශ්‍ය ගැටුමක් ඇති විය හැකියි.

- **ගරු සභාපති එච්.ජේ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.සමන්පා දිනේන්ද්‍ර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06-01-XXI** බණ්ඩාරගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පහසුකම් සහිතව ආයුර්වේද මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම විෂය අනුව 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ හා වෙනත් නීති යටතේ පළාත් පාලන ආයතනවලට බලය ලැබී ඇති පනත්වලට යටත්ව ආයුර්වේද පංචකර්ම මධ්‍යස්ථාන වල සේවාවන් සැපයීම තුළින් සහා අරමුදලින් දැරීමට සිදුවන වැය බර අවම කර ගැනීම සඳහා 2019.07.09 මාසික මහ සභාවේ තීරණ අංක 5-1-II අනුව තීරණය කරන ලද සහනදායී හා සාධාරණ ගාස්තු ක්‍රමය, ඇමුණුම් අංක 04 පරිදි සංශෝධනය කිරීමත්,එකී ගාස්තු පැනවීමටත් සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

**යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෝමසිරි දයාරත්න ගනේගොඩ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජේ.සමිත් ජානක ප්‍රනාන්දු මැතිතුමා - ජනතා විමුක්ති පෙරමුණ

මේක හොද වැඩක්. මේ සම්බන්ධව ආදායම් ලබා ගැනීමේ වැඩපිළිවලක් තියෙනවද? ආයුර්වේද පංචකර්ම වලට බඉහිර රටවල පවා ලොකු පිළිගැනීමක් තියෙනවා. සංචාරක කර්මාන්තයට පවා බද්දකරගන්න ඕන දේවල් මේවා. අපිට හොද වැඩපිළිවලක් නෑ මේක සමාජයට කියන්න අපිට මෙහෙම තැනක් තියෙනවා කියලා.

ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ

ඒක අපි සාකච්ඡා කළා. පළමුව බණ්ඩාරගම නගරයේ තියෙන රාජ්‍ය ආයතනවලට නිලධාරීන් වෛද්‍යතුමියන්ලා ගිහිල්ලා පංචකර්ම මධ්‍යස්ථානයෙන් වන සේවාව පිළිබඳවත් ලබා දෙන පහසුකම් පිළිබඳවත් ආයතන තුළ නිලධාරීන් දැන්වත් කිරීමටත් අත් පත්‍රිකා බෙදා දීමටත්. ඒ කටයුත්ත මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජේ.සමිත් ජානක ප්‍රනාන්දු මැතිතුමා - ජනතා විමුක්ති පෙරමුණ

මේ දැනුවත් කිරීමේදී රාජ්‍ය ආයතන වගේම පෞද්ගලික ආයතන බැංකු පද්ධතිය ඉලක්ක කරන්න.

- **ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෝමසිරි දයාරත්න ගනේගොඩ මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06-01-XXII** වර්තමානයේ රට තුළ පවත්නා අර්බුදකාරී වාතාවරණය හමුවේ ආහාර නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම මෙන්ම අහාර සුරක්ෂිතතාවය පිළිබඳ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලෙසට පළාත් පාලන කොමසාරිස්ගේ අංක LGD/7/හරිත දැයක් ගෙවතු වගා/2022 හා 2022.05.25 දිනැති ලිපිය මගින් දන්වා ඇත. ඒ අනුව සභා බල ප්‍රදේශයේ සභාව සතු ඉඩම්වල හා පරිශ්‍රයන්හි ගෙවතු වගා වැඩසටහන් හා ආහාර සුරක්ෂිතා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට යන්ත්‍ර සූත්‍ර,අමුද්‍රව්‍ය මිළදී ගැනීමටත්,ආහාර නිෂ්පාදන ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා බීජ හා පැල වර්ග සැපයීම,පොහොර ලබා දීම යටිතල පහසුකම් සැපයීම,ප්‍රවාහන පහසුකම් සැපයීම,සුභ සාධක වැඩසටහන් පැවැත්වීම යනාදී විවිධ වියදම් දැරීම වෙනුවෙන් රු.1,000,000.00ක මුදලක් සභා අරමුදලින් වියදම් දැරීම සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

**යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.අජිත් සෙනෙවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.**

ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ

මෙහිදී මූලිකව සභාව සතු වගා කළ හැකි ඉඩම් හදුනාගෙන තියෙනවා. මේ ඉඩම්වල සභාව මගින් කම්කරුවන් යොදාගෙන අල වර්ග එළවළු වර්ග ආහාර භෝග වගා කිරීමේ වැඩසටහනක් කරන්න තමයි මේ වනපවිට සූදානම් කරලා තියෙන්නේ. මේ වැඩසටහනට අපි සම්බන්ධ කර ගන්න බලාපොරෝතු වෙනවා ගොවිජන සේවා මධ්‍යස්ථානය. එහි අදාළ නිලධාරීන් සම්බන්ධ කරගෙන උප දෙස් ලබා ගන්න බලාපොරොත්තු වෙනවා. ඒ වගේම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පැත්තෙන් තරුණ සේවා නිලධාරීවත් යෞවන සමාජ හා වැඩිහිටි සංවිධාන සම්බන්ධ කරගෙන මේ වගා කටයුතු ආරම්භ කරන්න බලාපොරොත්තු වෙනවා. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවලට අයත් ඒ ඒ ඉඩම් වල මන්ත්‍රීතුමන්ලාත් සම්බන්ධ කරගෙන ඒ ඒ ප්‍රදේශවල යෞවන සමාජ, වැඩිහිටි සංවිධාන වලට ප්‍රජා සංවිධානවලට ලබා දෙන්න අපි සූදානම්. සභාව මගින් ඉඩම හාලා දෙනවා පහසුකම්ටික දෙනවා. ඒ වගේම පොදු අනෙකුත් ඉඩම් හාලා දෙන්න අපි කටයුතු කරනවා. සභාව සතු ඉඩම කිසියම් කාලයකට වගා කටයුතු සඳහා පමණයි ලබා දිම සිදු කරන්නේ. මේ සඳහා අපිට යම් මුදලක් වැය කිරීම සිදු වෙනවා. මේ තියෙන තත්ත්වය අනුව අපිට සමහර භාණ්ඩ මිලදී ගන්න සිදු වෙනවා. ඒ නිසයි මේ යෝජනාව ඉදිරිපත් කලේ. මේ සඳහා පක්ෂ විපක්ෂ සියලු දෙනා මැදිහත් වෙන්න අවශය මහපෙන්වීම ලබා දෙන්න.

ගරු ප්‍රාදෙශීය සභා මන්ත්‍රීනි ඩී.චම්පා ජයංගනී කන්නන්ගර මැතිනිය - එක්සත් ජාතික පක්ෂය

ගරු සභාපතිතුමනි, ඔබතුමන්ට ස්තුතිවන්ත වෙනවා මගේ ඉල්ලීම මත කොළමැදිරිය යෞවන සමාජයට මා ලබා දුන් ඉඩම හාලා වගා කටයුතු සඳහා සකස් කර දිම සම්බන්ධව. තරුණයින්ගේ එකමුතුව විශිෂ්ටයි. ඒ තරුණ ළමයි උනන්දුවෙන් එහි වගා කටයුතු කරනවා. බීජ ලබා ගැනීමේ ගැටළුවක් තමයි තියෙන්නේ. ඒ සඳහා ඔබතුමා ලබා දුන් සහයෝගයට ස්තුතිවන්ත වෙනවා.

ගරු ප්‍රාදෙශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.අජිත් සෙනෙවිරත්න මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ

වඳුරාමුල්ල ශ්‍රී රාහුල විද්‍යාලයේ යම් භූමි ප්‍රමාණයක් තියෙනවා. අක්කර ½ ක් විතර වගා කටයුතු සඳහා ගන්න පුළුවන්. විදුහල්පතිතුමිය සභාවට යෝජනා කරන්න කිව්වා ඒක එළි පෙහෙළි කරලා දෙන්න දෙමාපියන් ළමයි එක්ක හරි වගා වගා කරන්න අවශය කරන පසුබිම හදා ගන්නනම් කියලා. ඒ අවශ්‍ය පහසුකම්ටික ලබා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ

ඔබතුමා මගින් ඉල්ලීමක් ඉදිරිපත් කරන්න අපි ලයිස්තුවට ඇතුළත් කර ගන්නම්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජේ.සමිත් ජානක ප්‍රනාන්දු මැතිතුමා - ජනතා විමුක්ති පෙරමුණ

අපිත් වගා කටයුතු ආරම්භ කරලා තියෙනවා. ඔබතුමාගේ යෝජනාවත් හොඳයි. හැබැයි ඒක පිළිවලකට කරන්න ඕනා. තව දුරටත් අපිට නැති කරන්න මුදල් අපේ රටේ නෑ. ගොඩක් ව්‍යාපෘති පටන් ගන්නවා ඒවා ටික දවසකින් ඉවර වෙලා යනවා. මේ මුදල වෙන් කරනවා නම් මේකට නිශ්චිතව වග කියන නිලධාරියෙක් ඉන්න ඕනා මේ ව්‍යාපෘති අධීක්ෂනය කරනවා කියලා.නැත්නම් මේකෙ ප්‍රතිඵලයක් නෑ. සභාවේ මුදල් නාස්ති වීම පමණයි වෙන්නේ. ඒ වගේම මේ ව්‍යාපෘතියේ තොරතුරු අපිට ලබා ගැනීමේ හැකියාව තියෙන්න ඕනා. ඒ වගේම කෘෂිකර්මාන්තය සම්බන්ධව අවබෝධය තියෙන සම්ප්‍රදායික ගොවියන්ගේ උපදෙස් ලබා ගැනීමට හා අධික්ෂනයක් ලබා ගැනීමට වැඩපිළිවලක් සකස් කර ගන්න.

ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ

මේක ප්‍රජා අංශයෙන් තමයි අධීක්ෂණය වෙනක්නේ. ඒ කටයුතු විනිවිදභාවයකින් යුතුව සිදු වෙනවා. මේ කටයුත්තේ යම් වගකීමක් දෙන්න ඕන නිසා තමයි ගොවිජන සේවා නිලධාරීවත් ප්‍රදේශවල යෞවන සමාජ වැඩිහිටි සංවිධාන සම්බන්ධ කර ගන්නේ. කෘෂිකරම් උපදේශකවරු මෙහි වගා කටයුතු සම්බන්ධයෙන් උපදෙස් ලබා දීමේ වගකීම භාර ගත්තා. ඒ ඒ වගා කටයුතු කරන සංවිධාන සම්බන්ධ තොරතුරු ඒ අයට ලබා දෙන්න කිව්වා. ඒ අයත් සම්බන්ධ කරගෙන ඒ අධීක්ෂණ කටයුතු සහ උපදෙස් ලබා දීම් සිදු වෙනවා.

ගරු ප්‍රාදෙශීය සභා මන්ත්‍රී පියසේන වික්‍රමාරච්චි මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ

ගරු සභාපතිතුමනි, කෘෂිකර්මාන්ත සම්බන්ධව මේ දිනවල හැමෝම උනන්දුවක් දක්වනවා. මේ ව්‍යාපාතියේ සැළසුම් කොහොම සකස් වුනාද කියලා අපි දැනුවත් වෙලා නෑ. ඒක කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක වෙනවා නම් කොට්ඨාශ මට්ටමින් සම්බන්ධීකරණයක් තියෙන්න ඕනා. මේක කොට්ඨාශ මට්ටමින් කමිටු පිහිටුවලා නියෝජිතයින් හරහා හොයා බැලීමක් කරන්න ඕනා. මේ සම්බන්ධව සැළසුම්,අවශය දැනුම,තොරතුරු අපිට දෙන්න ඕනා. ඔබතුමා කිව්වා සභාව සතු ඉඩම්වල මේවා කරන්න මූලිකත්වය දෙනවා කියලා. සභාව සතු ඉඩම් තියෙන්නේ පොඩි පොඩි ඉඩම්. මේ කාලයේ හොරකම් බහුල වෙලා තියෙනවා. ඒ සම්බන්ධව විශේෂයෙන් සැළකිල්ලක් දක්වන්න ඕනා. මේක කොට්ඨාශ 20ටම සම්බන්ධිකරණය කරන්න පුළුවන් නිලධාරියෙක් පත් කරන්න.

ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ

මෙහිදී බල ප්‍රදේශයේ වගා කළ හැකි ඉඩම් ප්‍රථමයෙන් හදුනා ගන්නවා. කොට්ඨාශයේ මන්ත්‍රීතුමා සම්බන්ධීකරණය කරගෙන ඒ ඉඩම් වලට ගිහිල්ලා බලලා කෘෂිකර්ම නිලධාරීවත් ග්‍රාම නිලධාරීවත් සම්බන්ධ කරගෙන තමයි ඒ ඉඩමට සුදුසු භෝග වගාව මොකක්ද කියලා නිර්දේශ කරන්නේ. ඊට පස්සේ තමයි ඒ ප්‍රදේශයේ ස්වේච්ඡා සංවිධාන වලට ඒ ඉඩම වගා කටයුතු සඳහා ලබා දෙන්නේ. මන්ත්‍රීතුමන්ලා තමන්ගේ කොට්ඨාශයේ තියෙන ඉඩම් හදුනා ගැනීමට සහය දෙන්න. මේ වගාවේදී සභාවට ආර්ථික වාසි බලාපොරොත්තු වෙන්නේ නෑ. ඒක ඒ ඒ ප්‍රදේශවල ජනතාවට අලෙවි කරන්න තමයි බලාපොරොත්තු වෙන්නේ. මෙකෙදී ඒ ඒ ප්‍රදේශයේ ජනතාවගේ ආහාර අවශ්‍යතාවය සපුරා ගැනීම තමයි බලාපොරොත්තු වෙන්නේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී බී.ජී.සුනේත්‍රා මැතිණිය - එක්සත් ජාතික පක්ෂය

මේක කාලෝචිත යෝජනාවක්. මේ වන විට ජනතාව තුළ ගෙවතු වගාව සම්බන්ධව ලොකු උනන්දුවක් තියෙනවා. ඒක තවත් වැඩි කරන්න නම් අපි ගම්වල තියෙන ගොවි සමාජ, කාන්තා සමාජ සම්බන්ධ කර ගනිමින් ගෙවතු වගා තරඟ ගම් මට්ටමින් හෝ ආසන මට්ටමින් පවත්වනවා නම් ඒ අයව තවත් උනන්දු වීමක් සිදු වෙනවා. එතකොට මේ ගෙවතු වගා මෙතනින් අවසන් වෙන්නේ නැතුව දීර්ඝ කාලීනව පවත්වා ගන්න පුළුවන්.

ඔබතුමාට මම ඒක යෝජනාවක් ලෙස ඉදිරිපත් කරනවා. ඒ වගේම මන්ත්‍රීවරු ලෙස අපිත් සියලු දෙනාම හැම ගෙදරකම යම් භෝග ප්‍රමාණයක් හරි වවලා ආදර්ශමත් විදිහට ඒක කරන්න කියලා ආරාධනා කරනවා.

<u>ගරු ප්‍රාදෙශීය සභා මන්ත්‍රී එම්.එල්.රොෂාන් රාජිත මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>
මේ ව්‍යාපෘතිය ප්‍රදර්ශනාත්මක ව්‍යාපාතියක් නොවී ඒක අපි ඉදිරියට කරගෙන යා යුතුයි. යෞවන සමාජ මේ වන විට වගාව සඳහා නැඹුරු වෙලා තියෙනවා. මේකෙදී ඒ දරුවන්ට මේකට මුලින්ම උනන්දුව තියෙනවා නමුත් වවන ශාකය නොවැඩෙන කොට එලදාව අඩු වෙන කොට ඒ අය අතහැරලා දාන්න පුළුවන්. ඒ නිසා මේ සම්බන්ධව දැනුම තියෙන සාම්ප්‍රදායික ගොවියන්ව වැඩිහිටි පුද්ගලයින්ව මේකට සම්බන්ධ කර ගත යුතුයි. ගොවි සමිති වශයෙන් හරි ලියා පදිංචි කරගෙන ඒ සඳහා යොමු කරවන්න. ඒ තුළින් වැඩි අස්වැන්නක් ලබා ගැනීමට අවශ්‍ය දැනුම ලබා ගන්න පුළුවන්. මේ ව්‍යාපෘතියේදී ප්‍රධාන ආහාරයක් වශයෙන් ලබා ගත හැකි භෝග තමයි හිටවන්න ඕන කියන එකයි මගේ යෝජනාව. ඒ වගේම වගා කරන කොට එක් ඉඩමක එක් වර්ගයක් පමණක් වගා කළ යුතුයි.

<u>ගරු ප්‍රාදෙශීය සභා මන්ත්‍රී සෝමසිරි දයාරත්න ගනේගොඩ මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>
ඇසල මාසය වගා කටයුතු වලට එතරම්ම හොඳ නෑ. පුහු ඇහැළ කියලා ජනවහරේ කතාවක් තියෙනවා. මේ ව්‍යාපෘතිය සිදු කිරීමේදී පළපුරුදු ගොවියන්ගේ උපදෙස් ගන්න ඕනා. තරුණ පිරිස් තුළ වගාව සම්බන්ධව ලොකු දැනුමක් නෑ. ඒ වගේම දැන් ඉන්න වගා නිලධාරීන්ටත් ලොකු දැනුමක් නෑ. ඒ නිසා පාරම්පරික ගොවියන්ව මේ වැඩසටහනට සම්බන්ධ කර ගන්න පුළුවන් ම් මේ ව්‍යාපෘතිය සාර්ථක කර ගන්න පුළුවන්. බතල මඤ්ඤොක්කා වගේ හිටවන කොට ඒවා හිටවන කුම තියෙනවා. ඒ අනුව තමයි අස්වැන්න ලැබෙන්නේ. ඒ වගේම පලිබෝද හානි වළක්වා ගන්න කෙම් ක්‍රම තියෙනවා. ඒ වගේ ප්‍රායෝගික දැනුම තියෙන අය මේ කටයුත්තට සම්බන්ධ කර ගන්න කියලා මම කියනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චමින්ද දිසානායක මැතිතුමා - ජනතා විමුක්ති පෙරමුණ</u>
ලංකාවේ මඤ්ඤොක්කා වර්ග 21ක් තියෙනවා. මඤ්ඤොක්කා කෙටි කාලීන භෝගයක් නෙමෙයි. කෙටි කාලීන භෝග කීපයක් තමයි තියෙන්නේ. මුං ඇට කඩල කව්පි වගේ දේවල්. අලුත්ගම කොට්ඨාශයේ ගංතෙර පාරේ තියෙන ඉඩම කබොක් මිශ්‍ර ඉඩමක් තියෙන්නේ. ඒකෙ මඤ්ඤොක්කා වර්ග 21ටම සුදුසු පසක් තියෙන්නේ. මඤ්ඤොක්කා දණ්ඩක් හිටවනවා කියන එක ලේසි නෑ. ඒක නිවැරදි ක්‍රමවේදයකට නිවැරදි තාක්ෂණයෙන් හිටෙව්වොත් තමයි ඒකෙන් හරි අස්වැන්නක් ගන්න පුළුවන් වෙන්නේ. ඒ වගේම මේ ප්‍රදේශයේ වැව් 6ක් තියාගෙන අය වැයෙන් රු. 1000ක් මත්ස්‍ය  වගාවට වෙන් කරපු සභාවක් මේක. මේක තමයි හොදම වෙලාව වැව් 6න් එකක හරි මිරිදිය මත්ස්‍ය වගාව ආරම්භ කරන්න.

<u>ගරු ප්‍රාදෙශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.අජිත් සෙනෙවිරත්න මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>
මන්ත්‍රීතුමිය අපිත් ගෙවතු වගා සිදු කළ යුතුයි කියලා යෝජනා කළා. මමත් මගේ නිවසේ වගේම පිටත තැන්වල පවා ගෙවතු වගා කටයුතු කලා. පසුගිය කාලයේ ගොවිජන සංවර්ධන නිලධාරි, කු.ප.නි.ස ඇවිල්ලා ලොකු වගා වැඩසටහනක් කළා. එහිදී ආව පිරිසට හොද දැනුවත් කිරීමක් කලා. ගෙවත්තක් හදා ගන්න විදිහ තාක්ෂණික ක්‍රම ආදී සියල්ලක්ම දුන්නා. මමත් මගේ සියලුම වගා කටයුතු කරන්නේ කාබනිකව. කරල් එන්නේ නැති මල් එන්නේ නැති එකට හොදම කාබනික බොහොරක් තමයි කෙසෙල් ලෙලි පල් කරලා ඒ දියර ස්පේ කරන එක. ඒක මල් එන්න හොද කාබනික පොහොරක්.

- **ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.අජිත් සෙනෙවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

<u>**06-02.**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රනීත් වැලිවිටගේ මැතිතුමාගේ යෝජනා :-</u>

**6-2-I** 663/ඒ බණ්ඩාරගම නැගෙනහිර ග්‍රාමසේවා වසමේ ජනාධිපති මාවතේ අමරසිංහ මහතාගේ නිවස අසලින් වම් පසට ඇති අතුරු මාර්ගය තාර දමා සංවර්ධනය කිරීම සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

**යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුරංජිත් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.**

ගරු ප්‍රාදෙශීය සභා මන්ත්‍රී එම්.එල්.රොෂාන් රාජිත මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ
මේ පාර මම තාර දාන්න හිටිය පාරක්. කාගේ හරි උවමනාවට ඒ පාරට ABC ගෙනත් දාලා තියෙනවා. දැන් ඒ පාර හෝදගෙන යනවා. පාරවල් තියෙනවා මගේ කොට්ඨාශයේ ඕන තරම් තරන්න. ඔබතුමා පාරක් හදනවා නම් ඉවරයක් වෙන්න හදන්න. දැන් ආපහු යෝජනාවක් දානවා ඒ පාර සභා යෝජනාවකින් හදන්න. සභාපතිතුමා ඔබතුමා මේ ගැන හොයලා බලන්න.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රනීත් වැලිවිටගේ මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුරංජිත් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06-03.ගරු සභාපති එච්.ඒ.එච්. දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමාගේ හදිසි යෝජනා :-**

**6-3-I** බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවට අයත් අංක 121100104024069 දරණ සභාවේ පොදු අරමුදල් ජංගම ගිනුමේ 2022.06.21 දිනට රු. මිලියන 40ක පමණ ශේෂයක් පවතින අතර එම මුදලින් රු.ලක්ෂ 50ක (මිලියන 5ක) මුදලක් ස්ථාවර තැන්පතුවක ආයෝජනාය කිරීම සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

- **ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එල්.රොෂාන් රාජිත මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**6-3-II** වර්තමානයේ රටේ පවතින ගෑස් හිඟතාවය හා මිළ ගණන් ඉහළ යාම හේතුවෙන් දැනට ආදාහන කටයුතු සඳහා අය කරන ගාස්තුව සංශෝධනය කිරීමක් කළ යුතුය. ඒ අනුව එක් දේහයක් ආදාහනය කිරීම වෙනුවෙන් සභා බල ප්‍රදේශය තුළ පදිංචිකරුවන් සඳහා රු. 10,000.00ක ගාස්තුවක්ද,සභා බල ප්‍රදේශයෙන් පිටත පදිංචිකරුවන්ගේ දේහයක් ආදාහනය කිරීම වෙනුවෙන් රු.12,000.00ක ගාස්තුවක්ද අය කිරීම සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

**යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෝමසිරි දයාරත්න ගනේගොඩ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.**

ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ
මේ වන විට ලිට්රෝ ගෑස් සිලින්ඩරයක මිළ රු. 17193/-ක් වෙනවා. ලාෆ් ගෑස් සිලින්ඩරයක් රු.20675/-ක් වෙනවා. ගණන් බැලීමේදී එක් දේහයක් ආදාහනය කිරීම සඳහා රු.11385/-ක් වගේ සභාවට වැය කරන්න සිදු වෙනවා. මේ වන විට කළුතර දිස්ත්‍රික්කයේ අනෙකුත් සබාවල් ආදාහනාගාර ගාස්තු ඉහළ දාලා තියෙනවා. ඒ සභාවල් බල ප්‍රදේශා තුළ රු. 13000-14000ක් දක්වා වැඩි කරලා තියෙනවා. අපි එච්චර වැඩි කරන්න බලාපොරොත්තු වෙන්නේ නෑ. දිගින් දිගටම සභා මුදල් වැය කරලා ගෑස් මිළදී ගැනීම සිදු කරලා දේහයක් ආදාහනය කිරීමට සභා මුදල් වැය කරන්න සිද්ධ වෙනවා. අවම මුදලක් හරි අපි ගාස්තු සංශෝධනයක් සිදු කර

ගත යුතුයි. ඒ නිසයි මම මේ යෝජනාව ඉදිරිපත් කරන්නේ. මේ පිළිබඳව සළකලා බලලා මේ යෝජනාව සම්මත කරලා දෙන්න කියලා ඉල්ලීම කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජේ.සමිත් ජානක ප්‍රනාන්දු මැතිතුමා - ජනතා විමුක්ති පෙරමුණ
මේ අවස්ථාව ජනතාවට අතිශය අමාරු වෙලාවක් පසුගිය කාලයේ අපි මුදල් එකතු කරලා ආදාහන කටයුතු කරලා තියෙනවා. අපිට මේක සේවාවක් වශයෙන් සලකලා සිදු කරන්න බැරිද?

ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ
සේවාවක් විදිහට සළකලා බලලා තමයි මේ ගාන දැම්මේ. අනෙක් සභාවල රු.13000-14000ක් වගේ වැඩි කරලා තියෙනවා. ඒ නිසයි එච්චර ගානකට යන්නේ නැතුව අවම වියදමවත් මහ ඇරලා සභාවේ මුදල් ටික හරි ඉතිරි කර ගන්න රු. 10000/-ක් සභා බල ප්‍රදේශය තුළ ආදාහනයකට සුදුසුයි කියලා යෝජනා කරන්නේ. මේ වන විට හැමදාම ආදාහන 3 ගානේ සිදු කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චමින්ද දිසානායක මැතිතුමා - ජනතා විමුක්ති පෙරමුණ
අද කාලේ භූමිදානයක් කරන්න වලක් කපන්න ඔයිට වඩා අඩු මුදලක් යන්නේ. ඒ නිසා මිනිස්සු ගොඩක් පෙළනෙවා භූමිදාන වලට. මේ නිසා සුසානභූමියේ ඉක්මනින් ඉඩ ඇහිරෙනවා. ඒ ගැනත් හිතලා කටයුතු කලොත් හොදයි.

ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ
භූමිදාන අඩු කරන්න කියලා ආදාහනාගාර ගාස්තු අඩු කරන්න ගියොත් ඒක සභාවට ප්‍රශ්නයක් වෙනවානේ. පිට පළාත්වල අයත් අපේ ආදාහනාගාර ගාස්තු අඩු නිසා අපෙන් ආදාහනාගාරය ඉල්ලනවා.

ගරු ප්‍රාදෙශීය සභා මන්ත්‍රීනි ඩී.චම්පා ජයංගනී කන්නන්ගර මැතිනිය - එක්සත් ජාතික පක්ෂය
සභා බල ප්‍රදේශයෙන් පිට ගාන වැඩි කරලා සභා බල ප්‍රදේශයේ ගාන වැඩි නොකලොත් හොදයි නේද?

ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ
මේ දවස්වල සභා බල ප්‍රදේශයෙන් පිටත ඒවා ගන්නෙත් නෑ ගෑස් අර්බුදය නිසා. එහෙම කරලත් තමයි හැමදාම ආදාහන තුනක් කරන්න වෙලා තියෙන්නේ. ජනතාව ගැනත් සභාවේ මුදල් පිළිබඳවත් හිතන්න ඕනා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගුරුගේ මාධව දිලංක මැතිතුමා - ශ්‍රී ලංකා නිදහස් පක්ෂය
ගෑස් අර්බුදය මිනිස්සු ඇති කරපු එකක් නෙමෙයිනේ. මිනිස්සුන්ට කන්නවත් නැතිවූ ඉන්න කොට එයාලගෙන් මරණයක් වුන වෙලාවක රු. 10,000/-ක් වගේ මුදලක් ගන්න එක ඇත්තටම අසාධාරණයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.දර්ශන ප්‍රියන්ත පීරිස් මැතිතුමා - එක්සත් ජාතික පක්ෂය
ගරු සභාපතිතුමනි, සභාවේ ආදාහනාගාර ගාස්තු වැඩි කිරීම සම්බන්ධ මේ යෝජනාවට මම විරුද්ධයි.

ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ
මේකෙදී ජනතාව පීඩාවට පත් කරන්න නෙමෙයි ගාසුත් වැඩි කරන්නේ. සභාවේ වියදම් ආවරණය කර ගැනීමක් විතරයි. කවදාවත් මේ සභාවේ මුදල් නෑ කියලා සභාවේ සේවකයින්ගේ වැටුප් ගෙවීම ප්‍රමාද කරලා නෑ. තෙල් නැහැයි කියලා කසල අදින්නේ නැතුව ඉදලා නෑ. විදුලි බිල් හරියට ගෙවනවා. හැමෝම සභාව ගැනත් හිතන්න. මේකට බෙදීමක් ඉල්ලන්න එපා. සභාව පැත්තත් බලලා කටයුතු කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.දර්ශන ප්‍රියන්ත පීරිස් මැතිතුමා - එක්සත් ජාතික පක්ෂය
මේ සභාවේ රු. 2500 ඉදලා මේ වන විට රු. 10000ක් දක්වා ගාස්තු ගෙනත් තියෙනවා. මේ ගාස්තු වැඩි කිරීම් සම්බන්ධව දැඩි විවේචනයක් මගේ එල්ල වෙනවා. මේ සභාවේ මුදල් වියදම් කිරීම් සම්බන්ධව ප්‍රගතිශීලි මන්ත්‍රීවරු විදිහට ලැජ්ජාවට පත් වෙන්න ඕනා. ආන්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු සද්ද නැතුව ඉන්නවා. මේ ආදාහනාගාර ගාස්තු එක රුපියලකවත් වැඩි කරන එකට මම විරුද්ධයි. මාර්තු මාසේ අප්‍රේල් මාසේ වියදම් වාර්තා අරන් බලන්න එක එක බහු භූතවලට වියදම් කරලා තියෙනවා. බන්ඩාරගම ආසනයේ අහිංසක මනුස්සයෙක් මැරුණම රු. 10000/-ක් දීලා ආදාහනය කරන්න පුළුවන් තත්ත්වයක් දැන් මිනිස්සුන්ට නෑ. මේ

සභාවල් ලැජ්ජාවට පත් වෙන්න ඕනා අහිංසක මිනිස්සු දුක් විදින කොට ප්‍රාදේශීය සභාවල්වල 8600ක් සභිකයෝ ඉන්නවා මොකටද? රු.25000/- ගානේ එක එක දීමනා ග්නනවා. මේවා අයින් කරන්න ඕනා. මේ සභාවේ මම ඉල්ලීමක් කරනවා ආදාහනාගාර ගාස්තු වැඩි කිරීම සම්බන්ධව බෙදීමක් දෙන්න නැත්නම් සභාව තුළ අනෙක් මන්ත්‍රීවරු කැමතියි කියනවා නම් ඒකට ඉඩ දෙන්න මගේ විරෝධතාවය සටහන් කර ගන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගුරුගේ මාධව දිලංක මැතිතුමා - ශ්‍රී ලංකා නිදහස් පක්ෂය</u>
මේ යෝජනාව සම්මත වෙන නොවෙන එක වෙනම දෙයක්. නමුත් මිනිස්සුන්ට හැම තිස්සේම මේ අර්බුදය දෙන්න බෑ. කසල වලට රු. 6000ක් වැඩි කරනවා පෙට්‍රල් ඩීසල් වැඩි වුනා කියලා. එතකොට ඒක සභාවේ මුදල් නිකරුනේ නාස්ති කිරිමක් නෙමෙයිද? කසල ටික කළමණාකරණය කර ගන්න අපිට බැරි නම් විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරු විදිහට අපිත් ලැජිජ වෙන්න ඕනා. මේ ගාස්තු වැඩි කිරීමේ යෝජනාවට මමත් විරුද්ධයි.

- **ගරු සභාපති එච්.ජේ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෝමසිරි දයාරත්න ගනේගොඩ මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

(ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.දර්ශන ප්‍රියන්ත පීරිස් මැතිතුමා සභාවෙන් පිටව යන ලදි.)

**6-3-III** බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව සතු බැකෝ ලෝඩර් යන්ත්‍රය දැනට පැය 1ක කාලයක් සඳහා රු.3000.00ක මුදලකට කුළියට ලබා දෙන අතර රටෙහි පවතින වර්තමාන ආර්ථික තත්ත්වය තුළ ඉන්ධන හා අමතර කොටස්වල මිල අධික ලෙස විචලාා වන බැවින්, දැනට පවතින මිළ ගණන් සංශෝධනය කර බැකෝ ලෝඩර් යන්ත්‍රය පැය 1ක කාලයක් සඳහා වියදම ගණනය කර රු.6200.00ක් ලෙස ගාස්තු සංශෝධනය කිරීම සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

- **ගරු සභාපති එච්.ජේ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු උප සභාපති සරත් ආර්.රණසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**6-3-IV** 669/සී කිදෙල්පිටිය ජයන්ති ප්‍රජා මණ්ඩලය බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ අනුමත ප්‍රජා මණ්ඩලයක් ලෙස පිළිගෙන පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි .

- **ගරු සභාපති එච්.ජේ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෝමසිරි දයාරත්න ගනේගොඩ මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**6-3-V** ඍජු ශ්‍රම පදනම යටතේ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතීන් පවත්වාගෙන යාමේදී පුහුණු කම්කරුවන් සපයා ගැනීම ගැටළු සහගත වී ඇත. ඒ අනුව දිස්ත්‍රික් මිල ගණන් අනුව පෙදරේර්වකු සඳහා ගෙවනු ලබන මුදල වන්නේ රු. 2100.00කි. වර්තමානයේ පවතින මිල ගණන් අනුව පෙදරේරුවකු සඳහා රු.3500-4000ක මුදලක් අය කරනු ලබයි. දැනට ප්‍රාදේශීය වශයෙන් පවතින මිළ ගණන් අනුව රු.3500/- ක දෛනික ගෙවීමක් මත කාර්යය නිම කරන තෙක් පෙදරේරුවකු සඳහා දිනපතා ගෙවීම් කිරීම සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

- **ගරු සභාපති එච්.ජ්.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුරංජිත් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සහා සම්මත විය.**

**6-3-VI** 2022 වර්ෂයට අදාල පහත සඳහන් කර්මාන්ත ගෙවීම් අනුමත කිරීම සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | ගෙවීම් විස්තරය | ගෙවීම් ලබන්නා | ගෙවන මුදල (රු.) |
|---|---|---|---|
| 01 | බණ්ඩාරගම ඥාන ප්‍රදීප පුස්තකාලය තුළ පරිගනක පාඨමාලා පැවැත්වීම සඳහා වෙන්කරණය යොදා විදුලි උපාංග සවි කිරීම සඳහා වූ සියලුම අයිතමයන් සහිත නව සංශෝධිත ඇස්තමේන්තුව | රේරුකාන ග්‍රාම සංවර්ධන සමිතිය | 1,913,715.10 |

- **ගරු සභාපති එච්.ජ්.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුරංජිත් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සහා සම්මත විය.**

**6-3-VII** බණ්ඩාරගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවතින ප්‍රාදේශීය සභාව සතු ඌණ උපයෝජනයකින් යුක්ත ඉඩම් වගා කටයුතු සඳහා යෙදවීමටත් ඒ සඳහා මූලික ඉඩම් සැකසීම ප්‍රාදේශීය සභාව මගින් සිදුකර බෝග වගා කිරීම රැක බලා ගැනීම හා පරිභෝජන අවශ්‍යතා සපුරාදීම උදෙසා ඉඩම පිහිටි ග්‍රාම නිලධාරී වසමේ ප්‍රජා මණ්ඩලය, ගොවි සමිති, වැඩිහිටි සමිති, යෞවන සමාජ හෝ වෙනත් ලියාපදිංචි ස්වේච්ඡා සංවිධානයක් සමඟ බණ්ඩාරගම ප්‍රාදේශිය සභාව එකඟතාවයකට පත් වීම සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි .

- **ගරු සභාපති එච්.ජ්.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.අජිත් සෙනෙවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සහා සම්මත විය.**

**6-3-VIII** පවතින ඉන්ධන අර්බුදය හමුවේ කඩිනමින් ඉන්ධන ලබා ගැනීම වෙනුවෙන් සී/ස බණ්ඩාරගම විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවිය යුතු වූ, 2022.06.09 දින සිට 2022.06.15 දින දක්වා බිල්පත්හි වටිනාකම වූ රු. 280,841.00වූ මුදල පියවීම කඩිනමින් සිදු නොකළහොත් ඉන්ධන ලබා දීම නවතා දැමීමට සිදුවන බව ඉන්ධන පිරවුම්හල දැනුම් දී ඇති බැවින් සී/ස බණ්ඩාරගම විවිධ සේවා සමුපකාර සමිතිය වෙත රු. 280,841.00ක බිල්පත් වටිනාකම් මුදල ගෙවීම සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

- **ගරු සභාපති එච්.ජ්.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෝමසිරි දයාරත්න ගනේගොඩ මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සහා සම්මත විය.**

**06-04.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ඩී.චම්පා ජයංගනී කන්නංගර මැතිණියගේ හදිසි යෝජනා :-**

**6-4-I** කොළමැදිරිය තුන්වන පටුමඟ අඩි 30ක් පමන කොන්ක්‍රීට් හෝ තාර දමා සංවර්ධනය කිරීම සුදුසු බවට මා මෙම ගරු සභාවට යෝජනා කරමි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩී.චම්පා ජයංගනී කන්නන්ගර මැතිණිය විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එච්.ඉම්තියාස් මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**<u>06-05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන් පී.පෙරේරා මැතිතුමාගේ හදිසි යෝජනා :-</u>**

**6-5-I** රටේ පවතින වත්මන් අර්බුදවලට වත්මන් ජනපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා හට හෝ අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාට හෝ නිසි වැඩපිළිවලක් නොමැති බව පෙනී යන නිසාත් මේ සියල්ලට එකම විසඳුම ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සියලු පක්ෂ එකමුතුව සර්ව පාක්ෂික ආණ්ඩුවක් පිහිටුවීම බව පැහැදිලිව පෙනී යන බැවින් වහාම ජනාධිපතිවරයාත් අග්‍රාමාත්‍යවරයාත් ප්‍රමුඛ රජයටත් ඉල්ලා අස්වී සර්වපාක්ෂික ආණ්ඩුවකට ඉඩ සලසා දෙන මෙන් බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව නියෝජනය කරන ශ්‍රී ලංකා පොදුජන පෙරමුණු මන්ත්‍රී කණ්ඩායම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමු.

**යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එල්.රොෂාන් රාජිත මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එල්.රොෂාන් රාජිත මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>
මේ රට මුල ඉඳලම අර්බුදකාරී තත්ත්වයකට පත් වෙන්න කලින් අපේ පක්ෂ නායකයා මේක හරි තැනකට ගන්න උත්සාහයක යෙදුනා. ඒ වගේම පක්ෂ 11ක් එකතු වෙලා මේක යම් තැනකට ගන්න උත්සාහයක යෙදුනා. එක්තරා කඩාකප්පල්කාරී කොටසකගේ ක්‍රියා කලාපය නිසා මේක මහ නතර වුනා. මේ තත්තවය ඇතුලේ පත් කරපු අග්‍රාමාත්‍යවරයාගේ නොහැකියාව අපිට පේනවා. ජනාධිපතිවරයාත් මේ අසාර්ථකභාවයට වග කියන්න ඕනා. මම සතුටු වෙනවා රුවන් මන්ත්‍රීතුමා මේ යෝජනා ගෙන ඒම සම්බනධව අනෙක් මන්ත්‍රීවරුත් මේකට එකඟවෙයි කියලා හිතනවා. සියලු දෙනාම එකතු වෙලා මේ රට ගොඩ නැගීමට තමන්ගේ පටු වාසි ලාභ නොතකා දුක් විඳින ජනතාව වෙනුවෙන් ගෙනියන්න ඕන වැඩපිළිවලට සියලු දෙනාම සහයෝගය දිය යුතුයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජේ.සමිත් ජානක ප්‍රනාන්දු මැතිතුමා - ජනතා විමුක්ති පෙරමුණ</u>
මේක සම්බන්ධව එක දෙයක් දැන ගන්න කැමතියි. ජනාධිපතිවරයා ප්‍රමුඛ රජය අස්වෙන්න ඕනා කියලා තියෙනවා. විමල් වීරවංශ මැතිතුමා මුල ඉඳලම ජනාධිපතිවරයා ඉවත් වෙන්න කියලා කිව්වේ නෑ. දැන් ජාතික නිදහස් පෙරමුණ විදිහට ජනාධිපතිවරයා ඉවකත් විය යුතුයි කියන ස්ථාවරයේ ඉන්නවද?

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එල්.රොෂාන් රාජිත මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>
දේශපාලන නායකයින් ඒ පිළිබඳව මාව දැනුවත් කරලා නෑ. නමුත් අපිට තිබුන ගැටළුව තමයි ඒ අවස්ථාවේ ජනාධිපතිවරයා ඉවත් වෙන්න සුදුසු නැහැයි කිව්වේ බැසිල් රාජපක්ෂ කියන පුද්ගලයා මෙතනට එයි කියන සැකයක් අපිට තිබුන නිසා. ඔහුව ගේනවට එදා අපි පක්ෂයක් විදිහට විරුද්ධ වුනා. මේ මොහොත වන විට බැසිල් රාජපක්ෂ කියන පුද්ගලයා දේශපාලනයෙන් ඉවත් වෙලා තියෙනවා. දැන් ඔහුට අගමැති වෙන්න බෑ. ඒ නිසා ඔහු අයින් වුන දා ඉඳන් අපි එකඟයි ජනාධිපතිවරයා ඉවත්වීම සම්බන්ධව.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජේ.සමිත් ජානක ප්‍රනාන්දු මැතිතුමා - ජනතා විමුක්ති පෙරමුණ</u>
මේ යෝජනාව ඉදිරිපත් කිරීමට තරම් රුවන් මන්ත්‍රීතුමාට හයියක් තිබීම සම්බන්ධව මම සතුටුයි. මුළු රටම කියන්නේ ජනාධිපතිවරයා අසාර්ථකයි ඉවත් විය යුතුයි කියලා. අග්‍රාමාත්‍යවරයා රාජපක්ෂ පවුල රකින්න ආව කෙනෙක්. එතුමාට තමන් පත් වූ පස් වතාවෙම ධූර කාලය අවසන් කරන්න බැරි වෙද්ද අග්‍රාමාත්‍යවරයෙක්. ඔහුට ජනතාවගේ කැමැත්තත් නෑ පරාජිත මන්ත්‍රීවරයෙක් ඕනවටත් වඩා ඔප්පු කරලා පෙන්නලා තියෙනවා ඔහුට මුක්තු කරන්න බෑ කියලා. මේ යෝජනාවට තව දෙයක් එකතු විය යුතුයි. මේක සර්ව පාක්ෂික අන්තර්කාලීන ආණ්ඩුවක් විය යුතුයි. මේ 69 ලක්ෂයේ ජනවරම සමුපූර්ණයෙන්ම විකෘතියක් වෙලා. ඒකට ප්‍රතිපක්ෂව හිටපු පුද්ගලයා වර්තමානයේ අගමැතිවරයා බවට පත් වෙලා තියෙන්නේ. මේ මොහොතේ රට පත් වෙලා තියෙන තත්වයෙන් මුදවා ගන්න නම් අනිවාර්යෙන් මේ රටට ජන වරමක් අවශ්‍යයි. ඒක මේ මොහොතේ බැරි වෙන්න

පුළුවන් ඒක නිසයි අන්තර්කාලීන ආණ්ඩුවක් මාස 6ක් පවත්වලා මැතිවරණ දිනයක් නියම කර ගන්න ඕනා. ජනවරමක් තමයි ලෝකයේ ඕනෑම තැනක පිළිගැනීමක් තියෙන්නේ. මේ යෝජනාවට අපි එකඟයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් කොතලාවල මැතිතුමා - එක්සත් ජාතික පක්ෂය</u>
එක්සත් ජාතික පක්ෂය ඉන්නේ ජාතික වැඩපිළිවලක් හදන්න ඕන කියන තැන. අපි සහයෝගය දුන්නේ මේ රට ගොඩ ගන්න. රනිල් වික්‍රමසිංහ මැතිතුමා බෑග් මල්ලක් අරන් කොළඹට ඇවිල්ලා ලොකු ගෙවල් හදා ගත්ත මිනිස්සු නෙමෙයි. රනිල් වික්‍රමසිංහ මැතිතුමාට පිං සිද්ධ වෙන්න ඔබතුමන්ලා අද මේ සභාවේ වැඩි වෙලා ඉන්නේ. එතුමා තමයි මේ ඡන්ද ක්‍රමය ගෙනාවේ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන් පී.පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>
මම මේ යෝජනාව ගෙනාවේ පරම පවිත්‍ර චේතනාවෙන්. දේශපාලනය මෙතනට ඕන නෑ. මම කියන්නේ සියලුම පක්ෂ වලින් අගතියක් මේ රටට වෙලා තියෙනවා. කාටවත් කියන්න බෑ අපෙන් නෑ අරගොල්ලන්ගෙන් විතරයි කියලා. හැමෝම අංශු මාත්‍රයකින් හරි මේ අර්බුදයට වග කියන්න ඕනා. අර්බුදය කළමණාකරණය නොකිරීම සම්බන්ධව පොදුජන පෙරමුණු ආන්ඩුව වග කියන්න ඕනා. මේ අර්බුදය කළමණාකරණය නොකර ඒක ජනතාව වෙත විසුරුවා හැරීම සම්බන්ධව මේ ජනාධිපතිවරයා ප්‍රමුඛ රජය වග කියන්න ඕනා. අර්බුදයට හේතුව අපි නෙමෙයි කියලා කවුරුවත් කෑ ගැහුවට වැඩක් නෑ. දැන්වත් මේ ප්‍රාදේශීය සභාව ඇතුළෙන් හරි පක්ෂ වශයෙන් නොබෙදී ඉමු. සියලු දෙනාම වාද බේද නැතුව එකමුතු වෙන්න ඕන කාලයක්. තව දුරටත් පක්ෂ වශයෙන් බෙදෙනවා නම් තවත් වල පල්ලට වැටෙනවා. නියෝජිත දේශපාලනය මේ රටට කරලා තියෙන විනාශය හොඳටම ඇති. ඒ නිසා මේ වෙලාවේ අන්තර්කාලීන ආණ්ඩුවකට මමත් එකඟයි. මේ හැම පක්ෂයක් ඇතුළෙම හොඳ මිනිස්සු ඉන්නවා. ඒ අතලොස්සක් වෙන්න පුළුවන් ඒ අතලොස්ස හරි එකතු වෙනන් පුළුවන් නම් පක්ෂ පාට නැතුව රටක් හැටියට හිතලා කටයුතු කරන්න පුළුවන් නම් මේ රට මේ තත්ත්වයෙන් ගොඩ ගන්න පුළුවන්. මේ රට විනාශ කරපු පක්ෂ ක්‍රමය ජාති වාදය ආගම්වාදය සියල්ල අතුගාගා දාන්න ඕනා. ලෝක ප්‍රජාව කියනවා නම් සර්වපාක්ෂික ආන්ඩුවක් හැදුනොත් විතරයි මේක ගොඩ දාන්න පුළුවන් කියලා අන්න ඒක අපි හදාගමු. විපක්ෂනායකතුමාටත් කියන්නේ තව දුරටත් අපි වාද විවාද කරන්න හොඳ නෑ. ඉතිහාසය විසින් අපිට මොනවද අත්කරලා දීලා තියෙන්නේ කියලා බලන්න. බෙදිම තමයි අපිව හිඟන්නෝ බවට පත් කලේ. මම මේ යෝජනාව පොදුජන පෙරමුනේ මන්ත්‍රීවරයෙක් විදිහට ගෙනාවේ අපි සියලු දෙනාම එකතු වෙන්න ඒන නිසයි. ඒ නිසයි මේ යෝජනාව සභාගත කලේ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් කොතලාවල මැතිතුමා - එක්සත් ජාතික පක්ෂය</u>
ගරු සභාපතිතුමනි, මම මේ යෝජනාවට විරුද්ධයි. මොකද මේ රට විපතට පත් වෙලා තියෙන වෙලාවේ තමයි එක්සත් ජාතික පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමා මේ රට භාර ගත්තේ. රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැති වීමට ප්‍රථම මේක භාර ගන්න කියලා ඔය කියන නායකයින්ගෙන් ඉල්ලීම් කළා. කවුරුවත් ඉදිරිපත් වුනේ නෑ. රනිල් වික්‍රමසිංහ මැතිතුමා මේ රට භාර ගත්තේ මේ රට අන්ත අසරණ වෙච්ච අවස්ථාවක. ජාතික වැඩපිළිවලක් ගැන මුලින්ම කිව්වේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා. මේ රට හදන්න ඒක පාර්වික වැඩසටහනකට ජාතික ප්‍රතිපත්තියකට තමයි රනිල් වික්‍රමසිංහ මැතිතුමා මේ රට භාර ගත්තේ. එතුමා භාර ගත්තේ හිස් වෙච්ච රටක්. අවුරුදු 2 ½ ක් තිස්සේ විනාශ වෙච්ච රටක්.

<u>ගරු උප සභාපති සරත් ආර්.රණසිංහ මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>
මේ වන විට රනිල් වික්‍රමසිංහ මැතිතුමා පත් වෙලා මාස 1 ½ ක් විතර වෙනවා. ඔප්පු කරලා තියෙනවා මේ අරුබුදවලට එතුමාට විසඳුම් දෙන්න බෑ කියලා. තව අඩියත්වත් ඉදිරියට යන්න බැරි තත්ත්වයක් තියෙන්නේ. ජනාධිපතිවරයාත් අගමැතිවරයාත් විතරක් එකතු වෙලා මේ ප්‍රශ්නය විසඳන්න බෑ. ඒක නිසයි යෝජනා කලේ සර්ව පාක්ෂික ආණ්ඩුවක් පිහිටුවන්න. රනිල් වික්‍රමසිංහ මැතිතුමා පත් වුනා කියලා වෙච්ච වෙනසක් නෑ. මේ ආණ්ඩුව ගැන රටේ ජනතාවට විශ්වාසයක් නෑ. ඒ නිසා මේක මේ විදිහට ගෙනියන්න බෑ. ප්‍රශ්න වලට විසඳුමකුත් නෑ. ඒ නිසා සියලු පක්ෂ එකතු වෙලා අන්තර්කාලීන ආණ්ඩුවක් හදලා මාස 6ක් ඇතුළත මේ දැවෙන ප්‍රශ්න ටිකට උත්තර දෙන්න. ඒකට බල කිරීම් ඔබතුමන්ලා කරන්න. එහෙම නැති වුනොත් මහජනතාව සමඟ අපිත් පාරට බහිනවා. මේ යෝජනාවට අපිත් පක්ෂයි. පොඩි කාරණයක් තියෙනවා. පවතින ව්‍යවස්ථා රාමුව ඇතුළේ අගමැති

ජනාධිපති අයින් වුනාම එතන හිඩසක් අති වෙන නිසා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා සර්ව පාක්ෂික ආණ්ඩුව හදලා ගෙදර යන්න කියන යෝජනාව කරනවා.

<u>ගරු ප්‍රාදෙශීය සභා මන්ත්‍රීනි ඩී.චම්පා ජයංගනී කන්නන්ගර මැතිනිය - එක්සත් ජාතික පක්ෂය</u>
රුවන් මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාවට මමත් එකඟයි. මොකද අපේ දරුවන්ගේ දරුවොත් මේ වන විට රටේ ණය කාරයෝ වෙලා ඉවරයි. මේ රට කාටවත් මේ තත්ත්වයෙන් ගෙනියන්න බෑ. ඒ නිසා විපක්ෂයක් වශයෙන් මම මේ වෙලාවේ අපගේ එකඟතාවය ප්‍රකාශ කර සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් කොතලාවල මැතිතුමා - එක්සත් ජාතික පක්ෂය</u>
ඔබතුමන්ලා මේ යෝජනාව සම්මත කර ගන්න. මම ඉන්නේ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ඉවත් විය යුතුයි කියන තැන. දෙවන කාරණය මේ රටේ ජාතික ප්‍රතිපත්තියක් ගෙන්න කියලා කියන්නේ කවුද රනිල් වික්‍රමසිංහ මැතිතුමා මේ රට භාරගෙන තවම මාසයයි. ඔබතුමන්ලාගේ ආණ්ඩුව අවුරුදු අවුරුදු 2 ½ ක්තිස්සේ විනාශ කරපු රට භාර ගන්නේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා. ඒ නිසා එතුමා මේ රට විනාශ කලා කියලා කියන්න එපා.

<u>ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>
මේකෙ වරද තනිකරම පොදු පෙරමුණට එල්ල කිරීම වැරදියි. මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රට යුද්ධයෙන් බේරගන්න කොට අපි අභිමානයෙන් කතා කළා.කොන්ද කෙළින් තියාගෙන ගමක් ගමක් ගානේ ඇවිදින්න පුළුවන් වාතාවරණයක් එතුමා ඇති කළා. වර්තමාන තත්ත්වයත් එක්ක අපි තේරුම් ගන්න ඕනා මේ ප්‍රශ්නයෙන් මිදෙන්න නම් හැම දෙනාම එකතු වෙන්න ඕනා. මොනයම් හේතුවක් නිසා හෝ හැමෝම මේ ඇති වෙලා තියෙන තත්ත්වයට වග කියන්න ඕනා. ඒ මතේ ඉදලා මම කියන්නේ අද මේ රටේ ජනතාව විදින දුක අපිට ජේනවා. මේ තත්ත්වයෙන් මේ රට මුදවා ගන්න නම් පක්ෂ පාට භේද පැත්තකින් තියලා මනුස්සයෝ විදිහට සියලු දෙනාම එකතු වෙලා මේ රට බේරගමුයි කියන චේතනාවේ ඉදන් වැඩ කටයුතු කරමු. එතනදී මම ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා සර්ව පාක්ෂික ආණ්ඩුව හදලා ඉවත් විය යුතුයි කියන මතේ ඉදලා මම මේ යෝජනාවට එකඟ වෙනවා. සියලු දෙනාම පක්ෂ පාට,ආගම් බේද නැතුව අද මේ රටේ දුක්විදින ජනතාව වෙනුවෙන් අත්වැල් බැදගෙන මේ රට ගොඩනගමුයි කියන යෝජනාව කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.නෆ්ලි නසීර් මැතිතුමා - එක්සත් ජාතික පක්ෂය</u>
යෝජනාව කාලෝචිත යෝජනාවක්. අපි ප්‍රාදේශීය මට්ටමින් පාර්ලිමේන්තුව වගේ කෑ ගහගන්නවා වගේ දැක්කහම අපිට හිතා ගන්න පුළුවන්ද සර්ව පාක්ෂික එකඟතාවයකට එන්න පුළුවන්ද කියලා. රනිල් වික්‍රමසිංහ මැතිතුමාට දිගින් දිගටම චෝදනා කරනවා අසාර්ථක නායකයෙක් කියලා. නමුත් ජනාධිපතිතුමා අගමැතිකම භාර ගන්න කියපු වෙලාවේ කවුරුත් ඉදිරිපත් වුනේ නෑ.
ඒ වගේම කියන්න ඕනා අටුළුගම ඩෙංගු ව්‍යාප්තිය වැඩියි කියලා සෞඛ්‍ය අංශ දන්වලා තියෙනවා. ඒ සඳහා ඉදිරියේදී කරන්න ඕනා මොනවද කියලා හදුන්වා දෙනවා කිව්වා. ඒක ඉක්මනට කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වගේම අටුළුගම ප්‍රධාන පාරේ ගැටළුව සම්බන්ධව දිගින් දිගටම අපිට චෝදනා නැගෙනවා. ඒ අය ස්ව කැමැත්තෙන් ගෙවල් කඩලා දීලා තියෙන්නේ. ඒ නිසා ඒ අය බොහෝ ප්‍රශ්න රාශියකට මේ වැසි දවස්වල මුහුණ පෑවා. PRD එකේ ඉංජිනේරුවන් සමඟ පසුගිය සතියේ රැස්වීමක් කැදෙව්වා. එහිදී ඒ අය කියන්නේ ඉන්ධන ප්‍රශ්නය තමයි තියෙන්නේ ඉන්ධන ප්‍රශ්නය ඉවර වුන ගමන්ම පාරේ වැඩ පටන් ගන්නවා කියලා. ගමේ අයගෙත් මේ සම්බ්නධව ලොකු උනන්දුවක් තියෙන්නේ ගමේ අයව තෙල් පෝළිම්වල තියලා හරි අවශ්‍ය ඉන්ධන ටික ලබා ගන්නම් ඉන්ධනවලට ගෙවන්න ඒ අය ඒක කරලා දෙන්නම් කියලා ප්‍රකාශ කරනවා ඒ තරම් ජනතාව තුළ උනන්දුවක් තියෙනවා මේක ඉක්මනට කරන්න ඕන කියලා.
අපි ඉස්සරහට විශාල වැඩ කොටසක් සංවිධානය කරලා තියෙනවා ගමක් වශයෙන්. පසුගියදා අකාලයේ මිය ගිය අයිෂා දරුවා සම්බන්ධව සංවේගය ප්‍රකාශ කිරීමටත් මෙය අවස්ථාවක් කර ග්නනවා. ඒ වගේ සිදුවීම් මින් ඉදිරියට අටුළුගම සිදු නොවන්න ඕන කියලා හැමෝම එකතු වෙලා කණ්ඩායමක් වශයෙන් අටුළුගමින් මත්ද්‍රව්‍ය නැති කරන්න වැඩපිළිවලක් සංවිධානය කරගෙන යනවා. ඔබතුමාගේ උපදෙසුත් අපි බලාපොරොත්තු වෙනවා.

මේ ප්‍රදේශයේ තෙල් බෙදා හැරීමේ ෂෙඩ් 4ක් තියෙනවා. ඒවට තෙල් බෙදා හැරීමේ මොකක්හරි වැඩපිළිවලක් තියෙන්න ඕනා. හැමදාම තෙල් ගේනවා බෙදනවා මේකෙ ඉවරයක් නෑ. රටේ අභිවෘද්ධිය කියන එක නැති වෙලාද දන්නේ නෑ. අභිවාද්ධිය කියන්නේ දියුණුවක් කියන එක මේකෙ අරාබි වචනයක් තියෙනවා බර්කත් කියලා එකෙන් කියන්නේ ලැබෙන ප්‍රමාණය කළමණාකරණය කරගෙන භාවිතා කිරීම. ඒක මේ රටින් නැති වෙලා ගියාදෝ කියලා හිතෙනවා. මිනිස්සුන්ගේ ආකල්පවල ඉඳලා හැමදේම වෙනස් වෙන්න ඕනා. මිනිස්සු රැස් කර ගන්නවා අනිත් කෙනා ගැන හිතන්නේ නෑ. මේක අපේ ප්‍රදේශයෙන් හරි නැති කරන්න ඔබතුමා මැදිහත් වෙලා කටයුතු කරන්න වැඩපිළිවලක් දියත් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන් පී.පෙරේරා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එල්.රොෂාන් රාජිත මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර යෝජනාව සම්බන්ධව බෙදීමක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**07. කාරක සභා වාර්තා පිළිබඳ සමාලෝචනය කිරීම -**

**7.1.** 2022.05.19 දින පවත්වන ලද මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තාව සභාගත කිරීම. (ඇමුණුම් අංක 05)

2022.05.19 දින පවත්වන ලද ටෙන්ඩර් කමිටු වාර්තාව සභාගත කිරීම (ඇමුණුම් අංක 06)

**08. සභාවේ ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය කිරීම -**

**7-1.** 2022 අප්‍රේල් මස ආදායම් වියදම් වාර්තාව
**7-2.** 2022 අප්‍රේල් මස ලැබීම් විග්‍රහය
**7-3.** 2022 අප්‍රේල් මස ගෙවීම් විග්‍රහය
**7-4.** 2022 අප්‍රේල් මස හිඟ ශේෂ වාර්තාව සභාගත කිරීම.
(ඇමුණුම් අංක 07)

**09. තව දුරටත් සභාව තීරණය කරන ලදුව න්‍යාය පත්‍රයට ඇතුළත් කර ඇති කරුණු.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.සුනිල් ප්‍රනාන්දු මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>
ගරු සභාපතිතුමනි, අපි ලොකු අභියෝගයකට ලක් වෙලා තියෙනවා අපිම පිහිටවාගත්ත ජනාදිපතිතුමාව අයින් කරන්න කියලා අපිටම කියන්න වෙලා තියෙනවා. මෙතන ඉන්න ගොඩක් මන්ත්‍රිවරු එතුමාව ගේන්න ලොකු කැපවීමක් කලා. ජනාධිපතිතුමාට ඉවත් වෙන්න කියලා සර්ව පාක්ෂික ආන්ඩුවක් පිහිටුවා ගනන මේ යෝජනාවට මමත් සහයෝගය ලබා දෙනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චමින්ද දිසානායක මැතිතුමා - ජනතා විමුක්ති පෙරමුණ</u>
බණ්ඩාරගම ආසනය තුළ ඉඩම් කට්ටි කිරීමේදී ලොකුම ඉඩම තමයි කිදෙල්පිටිය අරලිය ඉඩම කියන්නේ. සභාවට අය විය යුතු 1% බද්දෙන් වැඩිම බදු මුදල අය වෙන්නේ මේ ඉඩමෙන්. එය මට දැනගන්න ලැබුන විදිහට ලක්ෂ 90ක් විතර වෙනවා. ඒ ඉඩමෙන් වෙන් කරපු පොදු භූමියට පර්චස් 159ක් වෙන් වුනා. ඒ වෙන් වුන ආකාරය ඉතාමත් ගැටළුකාරියි. එල් හැඩයට තමයි ඒ කොටස වෙන් වෙලා තියෙන්නේ. ක්‍රීඩා පිටියට සුසානභූමියෙන් කොටසක් ලබා ගන්න යෝජනාවක් ඉදිරිපත් වුනා. ඒ සුසානභූමිය අක්කර දෙකක් වගේ වෙනවා එතකොට ඒ සුසාන භූමිය අක්කරයකට පොඩි වෙනවා. ඔබතුමාගේ පාක්ෂිකයෝ රැස්වීමක් තියලා කිව්වා තාප්පයක් ගහන්න දෙන්නේ නෑ කියලා. නමුත් තාප්පය ගහලා ඉවරයි. මේ සම්බන්ධව ඔබතුමාගේ යෝජනාව මොකක්ද?

<u>ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>

අරලිය ඉඩමේ පොදු පහසුකම් කොටස වෙන් කිරීමේදී ගමේ ඉල්ලීමක් තිබුනා ඒ ප්‍රදේශයට ක්‍රීඩා පිටියක් ලබා දෙන්න කියලා. ඒ අනුව තමයි රැස්වීමක් සංවිධානය කරලා මටත් ආරාධනාවක් ලැබිලා ඒ සම්බන්ධව කතා කළේ. එතනදී තීන්දුවක් ගත්තා අරලිය ඉඩමෙන් එල් හැඩයේ බිම් කොටස ගන්නවා ඒ ගන්නේ සුසානභූමියේ කොටසක් මේ ක්‍රීඩා පිටියට යා කර ගන්න එතකොට ලොකු ක්‍රීඩා පිටියක් හැටියට හදාගන්න පුළුවන් කියලා. මේකේ ස්ථානීය පරීක්ෂාවට ඔබතුමාත් සහභාගී වුනා. මේ සම්බන්ධව ප්‍රාදේශීය ලේකම්තුමියත් සමගත් කතා කළා. එහිදී ප්‍රාදේශීය ලේකම්තුමිය අවසර දෙන්නම් කිව්වා ගමේ ජනතාවගේ කැමැත්ත අරගන්න කියලා. ඒ අනුව මම ලිපියක් සකස් කරලා ගමේ ජනතාවගේ අත්සන ගන්න යොමු කළා. ඔබතුමා රැස්වීම හා ස්ථානිය පරීක්ෂාව කරන කොට හිටපු පුද්ගලයෙක් හැටියට ඒ එකඟතාවයට ආවා. එහෙම තියෙද්දී අත්සන් ලේඛනය යන කොට අත්සන් කරන්න එපා  කියලා තියෙනවා. ඔබතුමා පළමු රැස්වීමේදී ඔය කතාව කියන්නේ නැතුව ක්‍රීඩා පිටියට සුසානභූමියෙන් කොටසක් ගන්නවට විරුද්ධයි කියලා ඒ වෙලාවේ කතා නොකර අත්සන් ලේඛනය යනකොට අත්සන් කරන්න එපා කියලා කියනවා. අද මේ ක්‍රියාව නතර වෙලා තියෙන්නේ ඒ අත්සන් ලේඛනය ප්‍රාදේශීය ලේකම්තුමියට ඉදිරිපත් කරන්න බැරි වීම නිසා. මම මේක අතහැරලා නෑ ක්‍රීඩා පිටිය කොහොම හරි ගමේ ජනතාවට ලබා දෙනවා. නමුත් එදා රැස්වීමේදී ඔබතුමා සුසානභූමිය ගන්නවට විරුද්ධ වුනා නම් මම ඉඩම ඔය විදිහට බෙදලා පොදු කොටස ගන්නේ නෑ. ඔක්කොම කළාට පස්සේ ඔබතුමා ගමේ අය තුළ විරෝධතාවයක් ඇති කරනවා නම් ඒ සම්බන්ධව මම කණගාටු වෙනවා.මේ ඉඩම ලැබුනට පස්සේ මම ඒ තාප්පය ඉවත් කරනවා. ඒ පදනම මත තමයි වෙළඳ කටයුතු කර ගන්න ඒ අවසරය ලබා දුන්නේ. ඒ ජනතාවට ක්‍රීඩාපිටියක් ලබා ගන්න අවශ්‍ය සහයෝගය ලබා දෙන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චමින්ද දිසානායක මැතිතුමා - ජනතා විමුක්ති පෙරමුණ</u>

සුසානභූමිය මැද්දෙන් තාප්පයක් ඉදිකරනවා කියන කතාව එදා සිදු කලේ නෑ. ඉඩමේ හැඩය සම්බන්ධව දැන්වත් වීමක් එදා වුනේ නෑ. පොදු පහසුකම් කොටස කනත්තට යා බදව ගන්න එකතොට කනත්ත වෙන් වෙන්නේ නෑ. මේකට මම පුද්ගලිකව විරුද්ධයි. ඉඩමෙන් ගන්න කොටස ඔබතුමා හතරැස් කොටුවක් විදිහට ගන්න ඉල්ලීමක් කරන්න. කනත්ත බෙදනවට මමත් ගමේ ජනතාවත් විරුද්ධයි. මේ සඳහා ප්‍රදේශයේ ස්වාමීන් වහන්සේලා, ගමේ ජනතාව සමඟ සාකච්ඡාවක් සංවිධානය කරන්න ඒ සාකච්ඡාවට අපිත් එන්නම්.

<u>ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>

සුසානභූමියෙන් කොටසක් ක්‍රීඩාපිටියට ගන්නවා කියන පදනමෙන්නේ මන්ත්‍රීතුමා ඒ කොටස ඒ විදිහට ලබා ගත්තේ. මම රැස්වීමක් සංවිධානය කරන්නම්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ඩී.චම්පා ජයංගනී කන්නංගර මැතිණිය - එක්සත් ජාතික පක්ෂය</u>

සභාපතිතුමනි, කොළමැදිරිය සදහම් යෞවන සමාජය ව්‍යාපෘතියක් වශයෙන් ඉඩමක වගා කටයුතු කරනවා. ඒ දර්වන්ට ලොකු දෙයක් කරන්න පුළුවන්. හැම බදාදා දිනකම කෘෂි උපදේශක ඇවිත් ඔවුන්ට උපදෙස් ලබා දෙනවා. ඒ අයට කරන්න බැරි දේවල් ටිකක් තියෙනවා. සුද්ද කිරීම් වගේ දේවල්. වැට හදාල දෙන්න සේවකයින් දෙදෙනෙක් ලබා දෙන්න කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා. මම අවශ්‍ය කරන වියදම් ලබා දෙන්නම් සේවකයින් දෙදෙනෙක් තමයි අවශ්‍ය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.අජිත් සෙනෙවිරත්න මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>

ගරු සභාපතිතුමනි, පසුගිය සභා වාරයේදීත් මම කතා කළා පිංවල මාතෘ සායන ගොඩනැගිල්ලේ වතුර ටැංකිය හා තවත් ද්‍රව්‍ය සොරා ගැනිම සම්බන්ධව. ඒ සොරුන්වත් වතුර ටැංකියත් පසුව සොයාගනු ලැබුවා. නමුත් පසුව පොලිසිය ඇවිල්ලා වතුර ටැංකිය පොලිසියට අරගෙන ගිහින් තියෙනවා. පොලිසියට පැමිණිලි දාන්න ගියේ සෞඛ්‍යවෛද්‍යතුමිය. නමුත් මේ වන තෙක් එතුමියව දැනුවත් කිරීමක් කරලා නෑ මොකක්ද කරන්න ඕන කියලා. ඔබතුමා පානදුර පොලිසියට කතා කරලා ඒ සම්බන්ධව මැදිහත්වීමක් කරන්න. මේ ද්‍රව්‍යටික නැවත ආයතන

භූමියට ලබා ගන්න. මේ ප්‍රදේශයේ සොරකම් දිගින් දිගටම යනවා. ඒ අසලම තියෙන වොලිබෝල් ක්‍රීඩා පිටියේ වටේට දැල් ගහලා තියෙන යකඩ බටයක් කපා ගෙන ගිහින් තියෙනවා. මම ඔබතුමාටත් ප්‍රාදේශීය ලේකම්තුමියටත් යෝජනාවක් දීලා තියෙනවා ආයතන භූමියේ පරිපාලන කටයුතු කරන්න ක්‍රමවත් වැඩපිළිවලක් දෙන්න කියලා. මේ සොරකන් කරන ද්‍රව්‍ය මිළදී ගන්න වෙනමස කොට්ඨාශයක් ඉන්නවා. වදුරාමුල්ල ශ්‍රී රාහුල විද්‍යාලයෙන් හොරකන් කරන ලද ඩෙස් පුටු වගේම ගබඩා කාමරයේ තිබුන ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය වගේ පොත්පත් මිලදී ගත්ත පුද්ගලයෝ කවුද කියලා දන්නවා ඒ ස්ථාන හොයාගෙන ගිහින් ඒවා ලබා ගන්න විදුහල්පතිතුමිය සූදානම් ඒකටත් මේ තෙල් අර්බුදය බාධාවක් වෙලා තියෙනවා. ඒ සඳහාත් මැදිහත්වීමක් කරන්න කියලපා ඉල්ලා සිටිනවා. අවුරුදු 100කට වඩා පැරණි ඉතිහාසයක් මේ පාසලට තියෙනවා. මේ පාසල රැක ගන්න අති විශාල කැප කිරීම් රාශියක් සිදු කරලා තියෙනවා. දැනට මේ තියෙන තත්ත්වයෙන් හරි මේ පාසල රැක ගැනීම අවශ්‍යයි. මේක රැක ගැනීමට සභාවක් විදිහටඅපිටත් වගකීමක් තියෙනවා. ඒ නිසා මේ කටයුතු සඳහා මැදිහත් වෙන්න කියලා ඉල්ලා සිටිනවා.

පිංවල සුසානභූමිය තුළ භූමිදාන විශාල වශයෙන් සිදු කරනවා. මේක තියෙන්නේ කන්ද උඩ කන්ද බෑවුමේ වලවල් කපලා භූමිදාන සිදු කරනවා. එතකොට පහළ ඉන්න අය චෝදනා කරනවා මේවා පසුකාලීනව කඩාගෙන පල්ලෙහාට එන්න පුළුවන් කියලා. ඒ නිසා භූමිදාන කටයුතු කිරීම පිළිබඳ දැනුවත් කිරීම් කරලා බෝඩ් එකක් දාන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රනිත් වැලිවිටගේ මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>

සභාපතිතුමනි, වගා සංග්‍රාමය ආරම්භ කරලා තියෙනවා. ඒකට යෞවන සමාජ ගොඩක් මැදිහත් වෙලා තියෙනවා. චම්පා මන්ත්‍රීතුමිය ඉඩමක් දීලා තියෙනවා වගා කටයුතු සඳහා ඒකේ සඳහම් යෞවන සමාජය අලුත් යෞවන සමාජයක් විදිහට එහි වගා කටයුතු හොදට කරගෙන යනවා. ඒ වගේම ග්‍රාම සේවා වසම් 59ක් තිබුනට තවම වසම් දෙකක විතරයි ආරම්භ කරලා තියෙන්නේ. වසම් 10ක විතර ක්‍රියාකාරීව ඉදිරිපත් වෙලා තියෙනවා වගා කරන්න කැමතියි කියලා. ඒ අයට ඉඩම් නැති ප්‍රශ්නයක් තියෙනවා. ඉඩම් නැති අයට වගා කටයුතු සඳහා සභාවේ ඉඩම් දෙනවා කියලා තිබුනා. ඒ වගේම යෞවන සමාජ කීපයක්ම ඉඩම් ලබා දෙන්න කියලා ඉල්ලීම් ලබා දීලා තිබුනා. ඒ අය වගා කරන්න ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වෙලා තියෙනවා වගේම ඒ අයට හොද දැක්මක් හයියක් තියෙනවා. ඒ අයට මම සුභ පතනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මලින්ද කළුආරච්චි මැතිතුමා - ජාතික ජනතා පක්ෂය</u>

මහවිල දෙල්ගස්වත්ත ඉඩම සම්බන්ධව අපි අදහස් දැක්වීම කරලා දින 4කට පස්සේ ඒ ඉඩම් කැබලි ලබා දුන්න පිරිසක් ඉඩම ඩෝසර් කළා. ඒ ඉඩම්වල හිමියෝ නෙමෙයි දැඩිව අවධානමට ලක් වෙලා තියෙන්නේ ඊට පල්ලෙහා ඉන්න අය. මේ ඉඩම ඩෝසර් කිරීම නිසා තිබුන පස් ටිකත් කානුවට ඇවිල්ලා පාර තවත් හිර වෙලා ඒ අය තවත් අගතියට පත් වෙනවා. මේ ඉඩම් ලැබුන අය ඔබතුමා හමුවෙන්න ඇවිත් තියෙනවා බිම් කට්ටි සැළසුම් අනුමත කර ගන්න.

<u>ප්‍රාදේශීය සභා මන්ත්‍රී මලින්ද කළුආරච්චි මැතිතුමා - ජාතික ජනතා පක්ෂය</u>

ගොවිජන සේවා ආයතනයේ හැම ගමකම කු.ප.නි.ස. කෙනෙක් ඉන්නවා. රජයේ නිලධාරීන් 5 දෙනෙක් ඉන්නවා. ඒ අයගෙන් වැඩ ගන්න ඕනා. ඉදිරියේදී ආහාර අර්බුදයක් එනවා නම් වැඩපිළිවලක් මේ වන විටත් තියෙන්න ඕනා.

<u>ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>

මේක මීට මාස 5-6කට කලින් රජයෙන් කළ යුතුව තුබුන වැඩක්. ඇත්තම කතාව අපිවත් අන්දලා ජනතාවත් රවට්ටපු කතාවක්නේ වෙලා තියෙන්නේ. අන්තිම මොහොතේ කන්න නැති වුනාම තමයි ජේන්නේ කන්න නෑ කියලා. සභාවක් විදිහට පක්ෂ භේදයෙන් තොරව බණ්ඩාරගම ආසනයේ මිනිස්සුන්ට කන්න දෙන්න අපිට කරන්න පුළුවන් හැකියාවෙන් කරන්න ඕනා. මේ වනකන් රජයේ ඔය කියන නිලධාරීන් 5දෙනා කිසිම වැඩ පිළිවලක් ක්‍රියාත්මක කරලා නෑ. ඒ පිළිබඳව විශ්වාසයකුත් අපිට තියාගන්න බෑ. මොන දේ වුනත් ගුටි කන්න වෙන්නේ ගමේ ප්‍රාදේශීය මට්ටමේ මහජන නියෝජිතයාට. ඒ නිසා අපිට එහෙම නොවන්න යම් කිසි වැඩ පිළිවලක් අපි ගත යුතුයි. සභාවක් විදිහට අපිට කරන්න පුළුවන් මොකක්ද ඒ දේ අපි පක්ෂ භේදයෙන් තොරව කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මලින්ද කළුආරච්චි මැතිතුමා - ජාතික ජනතා පක්ෂය</u>

ඒ වගේම මේ වන විට පවතින ඩීදල් අර්බුදය නිසා තණමල්විල,බුත්තල, වැල්ලවාය යන ප්‍රදේශවල දැනට වගා කරන අස්වැන්න මෙහෙ වෙලඳ පොළට ගේන්න විදිහක් නෑ. අපිට යම් කිසි ක්‍රමවේදයක් හදලා මේ අස්වැන්න මෙහෙට ගේන්න පුළුවන් නම් ජනතාවට අඩු මුදලට එළවළු ලබා දීමේ හැකියාවක් තියෙනවා. ඒ සඳහා මැදිහත් වීමේ හැකියාවක් මට තියෙනවා යනුවෙන් ප්‍රකාශ කරමින් මගේ කතාව අවසන් කරනවා.

<u>ගරු සභාපති එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා මැතිතුමා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ</u>

න්‍යායපත්‍රයට අනුව අද දින සභාවේ වැඩ කටයුතු අවසන්. අද දින සභාව වෙත පැමිණිලා සභාවේ කටයුතු නිසි ආකාරයෙන් සිදු කිරීමට සහයෝගය ලබා දුන්න ගරු උප සභාපතිතුමා ප්‍රමුඛ ගරු මන්ත්‍රී මණ්ඩලයටත්, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටත් බණ්ඩාරගම ජනතාවටත් මගේ ගෞරවනීය ස්තූතිය පුදකරමින් සියලු දෙනාටම සුභ දවසක් ප්‍රාර්ථනා කරමින් සභාවේ වැඩ කටයුතු අවසන් කරනවා.

පස්වරු 03.20 ට සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදි.

එච්.ඒ.එච්.දේවේන්ද්‍ර පෙරේරා
සභාපති,
බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව

එච්. ඒ. එච්. දේවේන්ද්‍ර පෙරේරා
සභාපති
බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව

**************************************************************